ආයතනයේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 290

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Name of the Institution : Ministry of Finance, Economic Stabilization and National Policies

Parliamentary Series : 290

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

| | | |
|---|---|---|
| ආයතනයේ නම | : | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක | : | **290** |

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 290

රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව

<u>පටුන</u>


| අනු අංකය | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුව | පිටු අංකය |
|---|---|---|
| 1. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 1 |
| 2. | ශ්‍රී ලංකා රේගුව | 2-8 |
| 3. | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 9-22 |
| 4. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 23-28 |
| 5. | ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව | 29-37 |
| 6. | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව | 38-39 |
| 7. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 40 |
| 8. | ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව | 41-42 |
| 9. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 43 |
| 10. | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව | 44-60 |
| 11. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | 61 |
| 12. | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 62 |
| 13. | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය | 63 |
| 14. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව | 64 |
| 15. | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 65 |
| 16. | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව | 66 |
| 17. | රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 67 |
| 18. | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 68 |
| 19. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | 69 |
| 20. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | 70 |

දෙපාර්තමේන්තුවේ නම : මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.**

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබු පියවර/ වර්තමාන තත්වය |
|---|---|
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරික්ෂාවන් කර නොතිබීම | අමාතතයාංශය සතු වාහන වල ඉන්ධන දහනය වීම සමබන්ධව පරික්ෂා කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර ගෙන යනු ලැබේ. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

එම්. එම්. සී. පී. මොනොට්ටිගෙදර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : ශ්‍රී ලංකා රේගුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

| | වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනා ගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදිකරගැනීම සඳහා ගනු ලැබූ පියවර/වර්තමාන තත්ත්වය. |
|---|---|---|
| පළමු කොටස: 68.00 | | |
| 1 | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි | රේගු දෙපාර්තමේන්තුව සතුව පවතින මේ වන විට නිරවුල් වී ඇති ඉඩම් ගොඩනැගිලි විස්තර නියමිත පරිදි යාවත්කාලීන කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. |
| 2 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ වලින් තොරතුරු ලබා ගෙන අවසාන පිළිතුර සකස් කරන බැවින් යම් ප්‍රමාදවීමක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ. ඉදිරියේදී මසක් ඇතුළත පිළිතුර ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. |
| 3 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ සියලු අංශ වෙත උපදෙස් ලබා දී ඇත. |
| 4 | 2017.06.26 දිනැති අංක 1/2017දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි | කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් හඳුන්වා දුන් NFAMS දත්ත පද්ධතියට ශ්‍රී ලංකා රේගුවේ සියලු වාහන වල තොරතුරු ඇතුළත් කර , ඒ බවට තහවුරු කිරීමක්ද CGO/NFAMS/V/02 ආකෘතිය මගින් සිදුකර ඇත.<br>අනෙකුත් වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් නියමිත පරිදි සිදු කර ඇති අතර චක්‍රලේඛ ප්‍රකාරව වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 5 | 2017.06.26 දිනැති අංක 1/2017දරන වත්කම් කළමනාකරණ චක්‍ර ලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි. | මේ වන විට වත්කම් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව රේගු දෙපාර්තමේන්තුවේ තොරතුරු ඉදිරිපත් කිරීමේ සම්බන්ධීකාරක නිලධාරියකු පත් කර ඇත.<br>අංක 01/2017 කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් හඳුන්වා දී ඇති NFAMS දත්ත පද්ධතියට ශ්‍රී ලංකා රේගුවේ සියලු වාහන සම්බන්ධීකරණය සඳහා දත්ත ඇතුළත් කිරීමේ හා සත්‍යාපනය කිරීමේ නිලධාරීන් පත් කර දන්වා යවා ඇත. |

| | | |
|---|---|---|
| 6 | 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 1 කොටසේ 11.1 ජේදයේ සඳහන් කාල රාමුව ඇතුලත මු.රෙ. 756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුණි. | පසුගිය වර්ෂ වල පැවති කොරෝනා වසංගතය, ආර්ථික අර්බුදකාරී තත්වය වැනි හේතු නිසා රේගු දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාල වකවානුව තුල සිදුකිරීමට නොහැකි වී ඇත. යාපනය, ත්‍රිකුණාමලය, හම්බන්තොට, ගාල්ල, මීගමුව ආදී විවිධ ප්‍රදේශයන්හි පිහිටා ඇති රේගු ප්‍රාදේශීය කාර්යාලයන්හි භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීමේදී හා එම සමීක්ෂණ වාර්තා වල නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු කාලයක් ගතවීම සිදුවුවත් ඉදිරියේදී පැවැත්වීමට නියමිත භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාල වකවානුව තුල අවසන් කර නියමිත දිනට විගණකාධිපති වෙත වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. |
| 7 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ජේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබිණි. | ඉන්ධන ලබාදීම සීමා සහිතව සිදු කරන ලද බැවින් ප්‍රායෝගිකව වාහන 109 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීම අපහසුය. ඉන්ධන කෝටා ක්‍රමය 2023 සැප්තැම්බර් මස සිට ඉවත් වී ඇති අතර මේ වන විට ඉන්ධන දහන පරීක්ෂාව වාහන කිහිපයක සිදු කර ඇත. |
| 8 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි | අක්‍රිය බැංකු ගිණුම් නොපවතී. |
| 9 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ නිරවුල් කර ඇත. |
| 10 | මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි. | අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවන පරිදි බැඳීම් ඇති කරගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| 11 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | ස්ථාන මාරුවීම්, මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල වසරකට වැඩි නිලධාරීන් 56 දෙනෙකුගෙන් අයවීමට තිබූ රු.4,215,575.81 ක මුදලින් නිලධාරීන් 20 දෙනෙකුගේ ණය ශේෂවල එකතුව වූ රු.499,215.01 ක මුදලක් මේ වන විට අයකර ගැනීම හා මු.රෙ.113 අනුව කපා හැරීමට කටයුතු කර ඇත. ඉතිරි නිලධාරීන් 36 කගේ ණය ශේෂ වල එකතුව වූ රු.3,716,360.80 ක මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 12 | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර රාජ්‍ය ආදායමට බැර කර ඇත. |
| 13 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත් කාර්යය නිම වූ වහාම නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. |
| 14 | අක් මුදල් සැසඳුම් ප්‍රකාශ අනුව අනාවරණය වී තිබුණු වෙනස්කම් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | අක් මුදල් සැසඳුම් ප්‍රකාශ නිසි පරිදි සැසඳුම් කර ඇත. නිරවුල් නොවූ අග්‍රිම ශේෂ නොපවතී. |
| 15 | ආයතනයට ලැබී තිබුණ විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම්ගත කල යුතු විදේශාධාර ලැබී නොතිබුණි. |
| 16 | විදේශ ප්‍රධාන ලෙස ලැබී තිබුණු සියලු මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | විදේශ ප්‍රදාන ලැබී නොතිබුණු බැවින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවීය. |
| දෙවැනි කොටස: 65.00 | | |
| 1 | ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි | 2023 සැප්තැම්බර් මස 07 වන දින තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) පිළිබඳව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා වැඩමුළුවක් තිරසර සංවර්ධන සභාවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.<br>ඒ අනුව, රේගු කටයුතු සඳහා තිරසර සංවර්ධන අභිමතාර්ථ අදාළ කරගැනීම පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් මූලික අවබෝධයක් ලබාගත් අතර, පහත සඳහන් රේගු කටයුතු හා සම්බන්ධ තිරසර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන ඇත.<br>1. රේගු බලධාරීන් විසින් සිදුකරන ලද ආදායම් රැස්කිරීම සහ වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ කාර්යයන්, දිළිඳුබව අඩු කිරීමේ ප්‍රයත්නයන් ඇතුළුව ජාතික සංවර්ධන සැලැස්ම සඳහා මූල්‍යයනය කරන මහා භාණ්ඩාගාරය සඳහා දායක වීම. |

| | | |
|---|---|---|
| | | 2. වෙළඳාම් කරන භාණ්ඩ සෞඛ්‍යය, ආරක්ෂක සහ පාරිසරික ආරක්ෂණ නියෝගයන්ට අනුකූලවනවා සේම ආහාර, ඖෂධ, ජලය සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සඳහා කාර්යක්ෂම සැපයුම් දාම පවත්වා ගන්නා බව තහවුරු කිරීම සඳහා දේශසීමාවන්හි දී අනෙකුත් නියෝජිතායතන සමග කටයුතු කරමින් රේගුව ප්‍රධාන කාර්යයක් ඉටු කිරීම.<br><br>3. ඊ-ඉගෙනුම් සහ දැනුම හුවමාරු කරගැනීමේ වේදිකාවන් හරහා රේගුව වෘත්තීය පුහුණුව සඳහා සමානාත්මක ප්‍රවේශයක් තහවුරු කිරීමේදී පරිපාලනයන්ට තිරසර සංවර්ධන ප්‍රවර්ධනය සඳහා දැනුම සහ නිපුණතා ලබාගැනීම සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කළහැකි වීම.<br><br>4. වෙළඳාම සඳහා පහසුකම් සැළසීම මගින් රේගුවට දේශසීමාවන්හිදී තත්වයන් වැඩිදියුණු කරමින් සහ ආරක්ෂාව තහවුරු කරමින් කාන්තා ව්‍යවසායකයින් සහ කුඩා පරිමාණ වෙළඳුන් ඇතුලුව ආන්තික ප්‍රජාවන් සඳහා නව වෙළඳපල  ප්‍රවේශයක් සඳහා අවස්ථා විවර කිරීම සඳහා උපකාරී වෙමින් පාරිභෝගිකයින්ට වැඩිවූ විවිධත්වය සහ අඩුවූ අසමානතාවන් දිරිමත් කළ හැකිවීම.<br><br>5. දේශසීමා ක්‍රියාමාර්ග සරල කිරීම සහ ප්‍රමිති කිරීම සහ වෙළඳාම සඳහා පැහැදිලි සහ පුරෝකථනය කළ හැකි තත්වයන් ඇති කිරීම මගින් රේගු පරිපාලනයන් නීත්‍යානුකූල ව්‍යාපාර සඳහා පහසුකම් සළසන අතර එමගින් ආර්ථික වර්ධනය සහ රැකියා අවස්ථාවන් වැඩිකිරීම.<br><br>6. රේගුවට බුද්ධිමය දේපළ අයිතිය (IPR) සඳහා ආරක්ෂාව සළසමින් නිර්මාණශිලීත්වය සහ නව්‍යකරණය සඳහා සහයවීම සඳහා අමුද්‍රව්‍ය නිසි වේලාවට සැපයිමට සහාය වීම.<br>7. නවීන රේගු පරිපාලනයක් මගින් සාර්ථක ලෙස ජාවාරම් සහ වංචා මැඩලමින්, දේශීය ප්‍රජාවන්හි අසාධාරණ තරඟකාරිත්වය අඩුකරමින්, සමාජය සහ පුරවැසියන් හානිවලින් ආරක්ෂා කරමින් සහ ආර්ථික තිරසාරත්වය සඳහා කාර්යක්ෂමව ආදායම එකතු කරමින් දේශසීමා අතර වෙළෙඳාම සඳහා පහසුකම් සැලසීම.<br><br>8. දේශසීමාවන්හිදී පාරිභෝගික භාණ්ඩ නිෂ්කාශනය සඳහා වගකිවයුතු නියෝජිතායතනය වශයෙන් රේගුව, දැඩි අවදානමක් ඇති කරන ව්‍යාජ පාරිභෝගික |

| | | |
|---|---|---|
| | | භාණ්ඩ ආනයනය කරන රටේ වෙළෙඳපොල වෙත නිදහස් කිරීමට පෙර හසුකර ගැනීමට සහ අල්ලා ගැනීමට හැකිවන බවට තහවුරු කිරීම.<br>9. පාරිසරික ප්‍රමිතීන් උල්ලංඝණය කිරීම් සහ සියළු වර්ගයේ වනජීවී ජාවාරම් ඇතුළුව සියළු ආකාරයේ පාරිසරික අපරාධ අධීක්ෂණය, අනාවරණය කර ගැනීම සහ වැළැක්වීම මගින් රේගුවට කැපී පෙනෙන ලෙස පරිසර දූෂණය ආශ්‍රිත අපරාධ වැළැක්වීම සහ පරිසරය ආරක්ෂා කිරීම.<br>10. අන්තරාදායක භාණ්ඩ සහ ආයුධ ජාවාරම වැළැක්වීම මෙන්ම වැරදිකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා සිය බලාත්මක කිරීමේ කාර්යය හරහා සාමය සුරක්ෂිත කරමින් රේගුව නිරන්තරයෙන් ශක්තිමත් රාජ්‍ය ආයතනයක් කරා සිය ගමන් මාර්ගය යොමු කිරීම.<br>11. වෙළෙඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර ගිවිසුම් සහ මෙවලම් අදාළ කර ගැනීම හරහා නීතිපාදක බහුපාර්ශවීය වෙළෙඳ පද්ධති වෙත දායක වන අතර ආර්ථික සංවර්ධනය සඳහා කටයුතු කරමින් රේගුව නිරන්තරයෙන් රාජ්‍ය සහ පෞද්ගලික අංශය යන දෙඅංශයෙහිම පුළුල් පරාසයක අනෙකුත් ක්‍රියාකරුවන් සමඟ සහයෝගී වීම. |
| 2 | හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි | ශ්‍රී ලංකා රේගුව විසින් 2024-2028 කාලවකවානුව සඳහා ඉදිරිපත් කර ඇති උපායමාර්ගික සැලැස්මෙහි, තිරසර සංවර්ධන අභිමතාර්ථවලට අදාළ රේගුවේ අභිමතාර්ථ, අරමුණු සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI's) හඳුනාගෙන ඉදිරි වර්ෂ සඳහා ක්‍රියාත්මක කිරීමට දැනටමත් කටයුතු කර ඇත. |
| 3 | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි | |
| 4 | පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි | පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලෙස සියළු අංශ දැනුවත් කිරීමට පියවර ගෙන ඇත. |

| | | |
|---|---|---|
| 5 | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි | උක්ත චක්‍රලේඛයේ අංක 05 යටතේ දක්වා ඇති පරිදි ආයතනයට අනන්‍ය වූ ක්‍රමවේදයක් නිර්මාණාත්මකව අනුගමනය කිරීම නිර්දේශ කර ඇත. ඒ අනුව යමින් මෙම දෙපාර්තමේන්තුවේ සංකීර්ණ වූ විෂයය ක්ෂේත්‍රයේ විශාල සංඛ්‍යාවක් ආවරණය කරමින් සකස් කර ඇති මෙම මානව සම්පත් සංවර්ධන සැලැස්ම වාර්ෂිකව නොකඩවා ක්‍රියාත්මක කරමින් පවතී. එසේම ඉදිරියේදී ඉහත චක්‍රලේඛයේ සඳහන් ආකෘතියට අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමට උපරිම උත්සාහය දරන බව දන්වමි. |
| 6 | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි | සමාලෝචන වර්ෂය සඳහා සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්මේ අඩංගු සියළුම වැඩ සටහන් 100 % සම්පූර්ණ කරන ලදී. එම සැලැස්ම, කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරී ස්ථරයන් සඳහාම නිර්දේශිත පුහුණු පැය සංඛ්‍යාව ලබා ගැනීමට හැකිවන පරිදි සකස් කර ඇතත් රේගු දෙපාර්තමේන්තුවේ පවතින දැඩි නිලධාරී හිඟය හේතු කොටගෙන (අනුමත නිලධාරී සංඛ්‍යාව 3090 ක් වුවද වර්තමාන නිලධාරී සංඛ්‍යාව 2205 කි) නිලධාරීන් සහභාගී කර ගැනීමේ අපහසුතාවය දැඩිව බලපා ඇත. |
| 7 | සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වී නොතිබුණි | රේගු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 08/98(1) හා 08/98/(11) හි විධිවිධාන අනුව කාර්යය සාධන ඇගයීම් ක්‍රමය භාවිතා කරන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි සඳහන් වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීම සිදු කර නැත. 2023.11.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018(1) අනුව වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි. |
| 8 | මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා රේගු දෙපාර්තමේන්තුව තුළ මානව සම්පත් සංවර්ධන අංශය ලෙස විශේෂ අංශයක් ස්ථාපිත කර ඇති අතර එය රේගු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. |
| 9 | සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි | සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණයෙන් 100% ක්ම ක්‍රියාත්මක කරන ලදී. |

| | | |
|---|---|---|
| 10 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. | 2021 වසරේ සිට මේ දක්වාසැම වසරක් සඳහාම රේගු දෙපාර්තමේන්තුව වෙත විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයක් ලබාදී ඇත. |
| 11 | මූ.රෙ. 119 ප්‍රකාරව අය කළ යුතු අධිභාරය අයකර නොතිබුණි. | අය කළ යුතු අධිභාරයක් නොතිබුණි. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා ශ්‍රී ලංකා රේගුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

පී.බී.එස්.සී. නෝනිස්
රේගු අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රේගුව

දෙපාර්තමේන්තුවේ නම : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.**

පළමු කොටස : 82.00

| අනු අංකය | වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනුලැබූ පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබීම | විගණන විමසුම් මඟින් ඉල්ලා සිටිනු ලබන තොරතුරු සඳහා නියමිත දිනට හෝ ඊට පෙර අදාල පිළිතුරු ලබාදිය යුතු බවට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති අතර, වර්තමානයේ නියමිත දිනට පිළිතුරු ලබාදිය නොහැකි නම් අතුරු පිළිතුරක් හෝ යැවීමට කටයුතු කරනු ලබයි |
| 02 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයා නොතිබිම | |
| 03 | 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ යේ 1 කොටසේ 11.1 ඡේදයේ කාල රාමුව ඇතුලත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත යොමුකර නොතිබීම | 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය 2022.06.08 දින භෞතිකව අවසන් බව විගණකාධිපති වෙත දැනුම් දී ඇති අතර, අපහරණ කටයුතු 2022.09.16 දින සිදුකර ඇත. භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් බව 2022.10.03 දින විගණකාධිපති වෙත වාර්තා කර ඇත.<br><br>එමෙන්ම 2022.12.31 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලසීමාව තුල අවසන් කර 2023.06.09 දින විගණකාධිපති වෙතද, 2023.06.27 දින කාර්යය නිම කළ බවට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙතද, වාර්තා කර ඇත. |
| 04 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා, පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම | අතිරික්තතා ගිණුම්ගත කිරීම සිදු කර ඇත, ඌනතා පිළිබඳව මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර, කමිටුව විසින් පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. කමිටු වාර්තා ලද පසු අදාල කාර්යන් අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 05 | සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම | ඉදිරියේදී මෙම කාර්ය ඉටු කිරිමට කටයුතු කරනු ඇත. |
| 06 | වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබිම | ගර්හිත වාහන අපහරණය කිරිමට අදාල සියලු වැඩ නිම කර එම වාහන වල ලියාපදිංචිය අවලංගු කිරිමට අදාල ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති අතර ලියාපදිංචිය අවලංගු වූ පසු දෙපාර්තමේන්තුවෙන් ඉවත් කිරීමට නියමිතව ඇත |

| | | |
|---|---|---|
| 07 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පරීක්ෂා කර නොතිබීම | පසුගිය සමයේ ඉන්ධන ලබා ගැනීමට තිබූ අපහසුතාවය නිසා ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරීම ප්‍රමාද විය. ඊට පසු අදාල කාර්ය සඳහා කමිටු 2 ක් පත් කර ඇති අතර 2023.12.31 දින වන විට වාහන 80% ක පමණ ඉන්ධන දහන පරික්ෂාව සිදු කර අවසන් වී ඇත. (අදාල කමිටු නිලධාරීන් වරින් වර 15 වන ජන හා නිවාස සංගණන රාජකාරි වල නිරත වීම නිසා ඉතිරි 20% අවසන් කිරීමට නොහැකි වී ඇති අතර එයද කඩිනමින් සිදු කිරීමට නියමිතව ඇත) |
| 08 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබීම | 2021.12.31 න් අවසන් වර්ෂයේ නිකුත් කළ නමුත් මාස 06 ට වඩා වැඩි කාලයක් තුල නිෂ්කාශනය නොවූ මුළු වටිනාකම රු. 263,541.80 ක් වූ චෙක්පත් 12 පැවතිනි.<br><br>එම සියළුම චෙක්පත් සම්බන්ධයෙන් 2022 වර්ෂය තුලදී පහත පරිදි ක්‍රියාකර නිරවුල් කර අවසන්ව ඇත.<br><br>• මුළු වටිනාකම රු. 252,291.80 ක් වූ චෙක්පත් තුනක් සඳහා හිලව් චෙක්පත් නිකුත් කිරීමෙන් අනතුරුව 2022 ජනවාරි මස තුලදී නිශ්කාෂණය වී ඇත.<br>• මුළු වටිනාකම රු. 11,250.00 ක් වූ ඉතිරි චෙක්පත් නවයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකල බැවින් 2022 වර්ෂය තුලදී මු.රෙ.396(ඇ) ප්‍රකාරව කටයුතු කර රජයේ ආදායමට බැරකර ඇත. |
| 09 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම | ණය ශේෂ නිරවුල් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය (ඇමුණුම 01) |

| [illegible] | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගත් පියවර / වර්තමාන තත්වය | | | | | |
|---|---|---|---|---|---|---|
| | වර්තමාන තත්වය | | | | | |
| | | නම හා තනතුර | දක්වා ඇති ශේෂය රු. | ණය අයකර ගැනීම රු. | 2023/12/31 දිනට ශේෂය රු. | ණය අයකර ගැනීමට ගෙන ඇති පියවර |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණයශේෂ පැවතීම | අ) මිය ගිය නිලධාරින් රු.158,650.00 | 1.) ඊ.එස්.සී. දයාරත්න (සංඛ්‍යාලේඛන නිලධාරි) | 65,900.00 | 65,900.00 | - | 2022 ඔක්තොම්බර් මස දී නිරවුල් කර ඇත. |
| | | 2.) කේ. විග්නේෂ්වරන් (ද.ස.ක්‍රි./ කේ.ලි.) | 92,750.00 | - | 92,750.00 | මෙම නිලධාරියාගේ අයවිය යුතු ණය මුදල් මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය වෙත යොමු කර ඇත. මරණ පාරිතෝෂිකය සැකසීම සඳහා යැපෙන්නන්ගේ වාර්තා ගෙන්වා ගැනීමට එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2023.10.20 දින යොමු කර ඇත. |
| | **එකතුව** | | **158,650.00** | **65,900.00** | **92,750.00** | |
| | ආ) සේවය හැර ගිය නිලධාරින් රු. 524,261.00 | 1.) ජී.එන්. පෙරේරා (සංඛ්‍යාලේඛනඥ) | රු.23,320.00 | රු.23,320.00 | - | 2023 ජූනි මස දී ගිණුම් පොත් වලින් කපාහැර ඇත. |
| | | 2.) එම්.ඒ.ඩී.ජී. පෙරේරා (කා.සේ.සේ.) | රු.27,305.00 | රු.27,305.00 | - | 2022.12.29 දින ගිණුම් පොත් වලින් කපා හැර ඇත. |
| | | 3.) ආර්.පී.එල්. සුසන්ත (කා.සේ.සේ.) | රු.17,050.00 | රු.17,050.00 | - | 2023.10.24 දින ගිණුම් පොත් වලින් කපා හැර ඇත. |
| | | 4.) ඩබ්.එම්.ජේ.සී. වීරකෝන් (සංඛ්‍යාලේඛන නිලධාරි) | රු.27,080.00 | - | රු.27,080.00 | ඇපකරු වෙත මෙම ණය මුදල ගෙවන ලෙස දන්වා ඇති අතර ඔහු විසින් මෙම ණය මුදල ගෙවීමේ හැකියාවක් නොමැති බව 2023.12.27 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. ණය කපාහැරීමට ඉදිරි කටයුතු කරමින් පවතී. |
| | | 5.) ඒ.ජී.එම්.එස්. කුමාර (සංඛ්‍යාලේඛන නිලධාරි) | 38,410.00 | - | 38,410.00 | මෙම නිලධාරියාගේ හැඳුනුම්පත් අංකයට අදාලව රියදුරු බලපත්‍රයක් නිකුත් කර ඇත්ද යන්න මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙතින් විමසා ඇත. මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 6.) ඩබ්.ජ්.ජේ.එස්. කුමාර (ද.ස.ක්‍රි./ කේ.ලි.) | 47,150.00 | - | 47,150.00 | නීතිපති උපදෙස් අනුව මෙම ණය මුදල වාරික හතරකින් ගෙවීමට අධ්‍යක්ෂ ජනරාල් (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපා.) විසින් අනුමත කර ඇති අතර, 2023.12.31 දිනට පෙර මුදල් ගෙවා නිම කරන ලෙස නිලධාරියාට දන්වා යවා ඇත. |
| | | 7.) කේ.එම්.ඩී.ආර්.පී. පෙරේරා (ද.ස.ක්‍රි./ කේ.ලි.) | 78,200.00 | - | 78,200.00 | මෙම නිලධාරිනිය මේ වන විට ශ්‍රී ලංකාවෙන් බැහැර වී ඇත්ද යන්න විමසා 2023.04.19 දිනැතිව ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලිපියක් හා සිහිකැඳවීම් යවා ඇතත් පිළිතුරු ලැබී නොමැත. |
| | | 8.) ටී.එච්. සරත් (කා.සේ.සේ.) | 6,572.00 | 6,572.00 | - | 2022 නොවැම්බර් මස දී නිරවුල් කර ඇත. |
| | | 9.) එම්.ජී.ඩී.කේ. ප්‍රියකැළුම් (කා.සේ.සේ.) | 104,250.00 | - | 104,250.00 | නිලධාරියා වෙත මෙම ණය මුදල නොපමාව ගෙවන ලෙස දැනුම් දී ඇතත් මෙතෙක් ගෙවීමට කටයුතු කර නැත. තවදුරටත් ණය මුදල පැහැර හරින්නේ නම් නීති මඟින් කටයුතු කරනු ලැබේ. |
| | | 10.) එම්.බී.ආර්.ජේ. බණ්ඩාර ( සංඛ්‍යාලේඛන සහකාර) | 95,140.00 | - | 95,140.00 | කොළඹ දිසා අධිකරණයේ නඩු අංක DMR/2724/2020 යටතේ පවරා ඇති නඩුව, වැඩිදුර විභාගය සඳහා 2023.11.06 දිනට නියමිත බව ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ විසින් දන්වා තිබූ අතර, දිසා අධිකරණය විසින් අප දෙපාර්තමේන්තුව වෙත තොරතුරු දැනුම් දීමට නියමිත වේ. |
| | | 11.) එම්.එස්.එම්. සෆ්රාස් (කා.සේ.සේ.) | 59,784.00 | - | 59,784.00 | ආ/04/කා.සේ.සේ./146 හා 2023.10.03 දින දරණ ලිපිය මගින් මෙම නිලධාරි මහතාට විරුද්ධව නඩු පැවරීම සම්බන්ධයෙන් වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විමසා ඇත. |
| | **එකතුව** | | **524,261.00** | **74,247.00** | **450,014.00** | |
| | ඇ) විශ්‍රාම ගිය නිලධාරින් රු. 82,790.00 | 1.) එච්.ජ්.ආර්.එස්.කේ. ජයසේකර (ක.සේ. නි.) | 82,790.00 | 82,790.00 | - | 2022 අගෝස්තු මස දී නිරවුල් කර ඇත. |
| | **එකතුව** | | **82,790.00** | **82,790.00** | - | |

දෙවන කොටස : 62.00

| අනු අංකය | වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනුලැබූ පියවර / වර්තමාන තත්වය |
|---|---|---|
| 01 | ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබානොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබීම. | අදාල ලේඛන යාවත්කාලිනව පවත්වාගෙන යනු ලබයි |
| 02 | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබීම | වර්තමානය වන විට දෙපාර්තමේන්තුව සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් නිසි පරිදි පිළියෙල කර ඇත. |
| 03 | පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රම වේදයක් සකස් කර නොතිබීම | සකස් කර ඇති පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය අධීක්ෂණය හා ඇගයීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර ක්‍රමවේදයක් පිළිබඳ සාකච්ඡා කරමින් පවතී. |
| 04 | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ යේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබිම | වර්තමානය වන විට මානව සම්පත් සැලැස්ම 90% ක ප්‍රමාණයක් අවසන් කර ඇත. |
| 05 | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබීම | 1. මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කරමින් පවතින අතර එහි ප්‍රගතිය 90% කි. එය සකස් කිරීමේදී විවිධ අංශ මගින් ඉල්ලා තිබූ පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගෙන 2023 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් සිදු කරන ලදී. (ඇමුණුම 02)<br>2. 2023/24 ජන හා නිවාස සංගණන කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා ටැබ්ලට් පරිගණක භාවිතය, සංගණන අර්ථ දැක්වීම හා ක්ෂේත්‍ර රාජකාරි පිළිබඳව පැය 8 බැගින් දින තුනක් පුහුණු අංශයේදී හා දිස්ත්‍රික්ක 25 හි දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී පුහුණු වැඩසටහන් පවත්වන ලදී.<br>3. ඒ අනුව කාර්ය මණ්ඩලයේ 95% කට වැඩි පිරිසකට පැය 12 කට වැඩි පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| 06 | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබිම. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 (I) අනුව 2023 වර්ෂයේ සිට වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම අවශ්‍ය නොවේ. |
| 07 | මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු නම් කර නොතිබීම | නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ (පුහුණු) නම් කර ඇත. |

| | | |
|---|---|---|
| 08 | සැලසුම්ගත පුහුනු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතීම | 1. මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කරමින් පවතින අතර එහි ප්‍රගතිය 90% කි. එය සකස් කිරීමේදී විවිධ අංශ මඟින් ඉල්ලා තිබූ පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගෙන 2023 වර්ෂය සඳහා පුහුණු වැඩසටහන් සිදු කරන ලදී. (ඇමුණුම 02)<br>2. 2023/24 ජන හා නිවාස සංගණන කටයුතු සඳහා දෙපාර්තමේන්තුගත සියලුම නිලධාරීන් සඳහා ටැබ්ලට් පරිගණක භාවිතය, සංගණන අර්ථ දැක්වීම හා ක්ෂේත්‍ර රාජකාරි පිළිබඳව පැය 8 බැගින් දින තුනක් පුහුණු අංශයේදී හා දිසත්‍රික්ක 25 හි දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලදී පුහුණු කරන ලදී.<br>3. ඒ අනුව කාර්ය මණ්ඩලයේ 90% කට වැඩි පිරිසකට පැය 12 කට වැඩි පුහුණු අවස්ථා ලබා දී ඇත. |
| 09 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ වීම. | |
| | පහත හේතූන් මත තත්ත්වාගණනය කළ මතය ලැබී ඇත. | |
| | 09.1<br>• වෙනත් ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස්කල ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබීම<br>• 2021.12.31 දිනට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ අග්‍රිම ශේෂය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබීම<br>• අග්‍රිම සැසඳුම් ප්‍රකාශය සඳහා සංශෝධිත ACA 07 ආකෘතිය භාවිතා කර නොතිබීම | මේ සඳහා 2022 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන තුලින් අවශ්‍ය ගැලපීම් කර ඇති අතර,<br><br>2022 වර්ෂයේ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පිරිසිදු විගණන මතයක් ලැබී ඇත. |
| | 9.2<br>මු.රෙ. 770(2) අනුව විධිමත් වත්කම් අපහරණ නියෝග ලබා නොගෙන වත්කම්, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කිරීම | අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය මත එලෙස කටයුතු කර ඇත. වර්තමානයේ තක්සේරු කමිටු හා දෙපාර්තමේන්තු අපහරණ කමිටු නිර්දේශ මත දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය හා ඊට අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අපහරණය කරනු ලැබේ. ඒ අනුව වත්කම් පොත් වලින් ඉවත් කරනු ලබයි. |
| | 9.3<br>2020.12.31 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පරිදි විකිණීමට නිර්දේශිත භාණ්ඩ විකුණුම් ලෙස වත්කම් වලින් ඉවත්කර තිබීම. | 2023 වර්ෂය වන විට සිදුකළ සියලුම අපහරණය කිරීම් CIGAS ගිණුම් පොත් වලින් නිවරදිව ඉවත් කිරීමට කටයුතු කර ඇත. |
| | 9.4<br>මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේ අඩුපාඩු | දක්වා ඇති වත්කම් 2022 වර්ෂයේ CIGAS හරහා ගිණුම්ගත කර 2022 මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර ඇත. |

| | | |
|---|---|---|
| 10 | රජයේ ගිණුම් කාරක සභාවේ නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කර නොතිබීම | |
| | 10.1 ක්‍රියාකාරී සැලැස්ම ඉටුකිරීමේ දී ප්‍රමාදයන් හා අඩුපාඩුන් පැවතීම | ක්‍රියාකාරී සැලැස්මට හා එහි සංශෝධනයන්ට අනුගතව කටයුතු කරනු ලබයි. |
| | 10.2 කාර්යය මණ්ඩල පුරප්පාඩු පැවතීම.<br><br>• දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතීම | • රාජ්‍ය අයවැය චක්‍රලේඛ 03/2022 ප්‍රකාරව රාජ්‍ය සේවයට බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇතත්, දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා 2023.03.15 හා 2023.06.27 යන දිනැති ලිපි මඟින් අග්‍රමාත්‍ය කාර්යාලයේ රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කර ඇති කමිටුව වෙත ඉදිරිපත් කර ඇතත් ඒ සඳහා අනුමැතිය නොලැබුනි. නැවතත් දෙපාර්තමේන්තුගත තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා සීමිත හා විවෘත පදනම යටතේ බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ඉල්ලා 2023.10.12 දිනැතිව කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපිලේඛන ඉදිරිපත් කර ඇත. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය තුළ පවතින ප්‍රාථමික ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා සංවර්ධන සහායකයන්, රජයෙන් නිකුත් කර ඇති විධිවිධානවලට අනුකූලව බඳවා ගැනීමට කටයුතු කර නිකුත් කර ඇති විධිවිධානවලට අනුකූලව බඳවා ගැනීමට කටයුතු කර ඇත. තවද පුරප්පාඩු වී ඇති තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා ක්‍රමවේද සකස් කර ඇත. |
| | • අධිකරණමය ක්‍රියාමාර්ගයක් නිසා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පිරවීම සම්බන්ධයෙන් 2007 වර්ෂයේ සිට ගැටලුකාරී තත්ත්වයක් පැවතීම හේතුවෙන් තනතුරු පුරප්පාඩුව පැවතීම | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ,සංඛ්‍යාලේඛනඥ විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකරන ලද නඩු ක්‍රියාමාර්ගය හේතුවෙන් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පිරවීම සම්බන්ධයෙන් 2007 වර්ෂයේ සිට ගැටලුකාරී තත්ත්වයක් පැවතිනි.නමුත් ගරු **ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2022.12.14 දින එම නඩුව නිශ්ප්‍රභා කර ඇත. ඉන් අනතුරුව දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදී.**<br>• පුරප්පාඩු පවතින අධ්‍යක්ෂ (සංඛ්‍යාන)තනතුරු පිරවීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිසමේ අනුමැතිය ලබාගෙන ඇති අතර ,2024 මුල්භාගය තුළදී අදාල තනතුරු ස්ථිරවම පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>• ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩු කෘත්‍යය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුර සඳහා ස්ථිර පත්වීම් ලබාදීම තාවකාලිකව අත්හිටවූ අතර පරීක්ෂණයක් මඟින් තේරී පත් වූ නිලධාරීන් 29 දෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා පත් කරන ලදී.<br>• ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති එම නඩුව 2022.12.14 දින නිශ්ප්‍රභා වීමෙන් අනතුරුව නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුරේ රාජකාරි ඉටුකිරීමට පත්කරන ලද නිලධාරීන් වෙත ස්ථිර පත්වීම් ලබාදෙන ලෙස සිදුකළ ඉල්ලීම අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිලධාරීන් 28 දෙනෙකු |

| | | |
|---|---|---|
| | | වෙත ස්ථිර පත්වීම් ප්‍රදානය කරන ලදී. එම නිලධාරීන් 28 දෙනා අතුරින් 19 දෙනෙකු මේ වන විට විශ්‍රාම ලබා සිටින අතර දැනට දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුරු 09ක් සම්පූර්ණ වී ඇත. තවද ඊට අමතරව නිලධාරීන් 15 දෙනෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංඛ්‍යාන) තනතුරෙහි රාජකාරි ඉටුකිරීම සඳහා පත් කර ඇත. ඒ අනුව පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරිම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලැබී ඇති අතර මේ වන විට ඒ සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී.<br>• අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංඛ්‍යාන) තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ විධායක සේවා ගණයට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා 2023.12.22 දින ඉදිරිපත් කර ඇත. |
| | 10.3<br>ජන හා නිවාස සංගණනය 2012 දෙමළ භාෂා වාර්තා ඉදිරිපත් නොකිරීම | 2012.03.19 දින අවසන් සංගණනය සිදුකිරීමට කටයුතු සිදුකළ අතර, දත්ත ස්කෑන් තාක්ෂණය භාවිතයෙන් දත්ත පරිගණක ගත කිරීමෙන් අනතුරුව අතුරු වාර්තා කිහිපයක් නිකුත් කර ඇත.<br>1. 2012 වර්ෂයේදී නිවාස පිළිබඳ මූලික වාර්තාව (භාෂා තුනෙන්ම)<br>2. 2014 වර්ෂයේදී ජනගහනය පිළිබඳ මූලික වාර්තාව (භාෂා තුනෙන්ම)<br>4. 2015 වර්ෂයේදී 2012 සංගණනයේ අවසන් වාර්තාව (භාෂා තුනෙන්ම )<br>සකස්කර වෙබ් අඩවියේ පළකර හා මුද්‍රණය කර ඇත. |
| | 10.4<br>ප්‍රජා විද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය 2014/2015<br>2015 දී අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි වීම | 2016 වර්ෂයේ දී අදාළ සමීක්ෂණය CAPI (Computer Assisted Personal interview ) ක්‍රමවේදය භාවිතා කරමින් සාර්ථකව සිදු කෙරුනි. දත්ත ගොනු සකස්කර විශ්ලේෂණයන් අවසානයේදී අදාළ අවසන් වාර්තාව 2017 වසරේදී මුද්‍රණය කරනු ලැබූ අතර මෘදු පිටපත දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පලකරන ලදී. තවද, එමගින් ලබා දීමට අපේක්ෂිත දර්ශක සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දී ඇත.<br>ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සෑම සංගණනයන් හා සමීක්ෂණයක් සඳහාම තොරතුරු තාක්ෂණය භාවිතා කරනු ලබන අතර මේ වන විට දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන විශාලම දත්ත රැස්කිරීමක් වන 2024 ජන හා නිවාස සංගණනය ටැබ්ලට් පරිගණකය භාවිතා කරමින් සිදු කරනු ලබයි. එහිදී ටැබලට් පරිගනක ආධාරයෙන් දත්ත රැස්කිරීම සිදුකරනු ලබයි. |
| | 10.5<br>ජාතික ගිණුම් සකස් කිරීමේ 2002 පාදක වර්ෂය 2010 ලෙස වෙනස් කිරීමේ දී 2014 වර්ෂයේ ආර්ථික වර්ධන අනුපාතය වෙනස්වීම | ජාතික ගිණුම් සකස් කිරීමේ දී අන්තර් ජාතික මාර්ගෝපදේශ භාවිතාකරනු ලබයි. ඒ අනුව 2010 පාදක වර්ෂය ලෙස වෙනස් කිරීමේ දී ජාතික ගිණුම් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික ක්‍රමවේදය වන SNA 2008 භාවිතා කර ඇත. එහි නිර්දේශයන් අනුව පාදක වර්ෂය යම් කාල පරාසයකට පසුව වෙනස් කළ යුතුවේ. එසේ පාදක වර්ෂය වෙනස් කිරීමට ප්‍රධාන හේතුවන්නේ, |

| | | |
|---|---|---|
| | | • ආර්ථිකයක් තුළ කාලානුරූපව සිදුවන ව්‍යුහාත්මකවෙනස්වීම්, නිෂ්පාදනයේ සිදුවන වෙනස්කම්, මිළ ගණන්වල සිදුවන වෙනස්කම්<br>• අඛණ්ඩව ආර්ථිකයේ සිදුවන වර්ධනයන්, නවෝත්පාදන, නව නිපැයුම්<br>• පාරිභෝජන රටාව, උපයෝගීතාවය තුළ සිදුවන වෙනස්කම්<br>ඒ අනුව 2015 වර්ෂයේ දී ජාතික ගිණුම් පාදක වර්ෂය 2010 ලෙස ද වර්තමානය වන විට පාදක වර්ෂය 2015 ලෙස භාවිතා කරමින් ජාතික ගිණුම් සකස්කරනු ලබයි. මෙසේ කලින් කලට පාදක වර්ෂය වෙනස් කිරීම තුළින් ආර්ථිකයේ යථා තත්වය නිවැරදිව පිළිබිඹු කිරීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. |
| 11 | නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156 (1) ප්‍රකාරව අයකර නොතිබීම | • මු.රෙ.770(ආ) ප්‍රකාරව අනතුරකට පත් වූ අංක PC-2421 කැබ් රථයේ වර්තමාන තක්සේරු වටිනාකම මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද තක්සේරු කමිටුවක් මගින් තක්සේරු කර ලබා දී ඇත. ඒ අනුව මු.රෙ.104(4) ප්‍රකාරව රජයට සිදු වූ හානි හා පාඩුව සම්බන්ධයෙන් වගකිව යුත්තන් තීරණය කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් විසින් 2024.01.05 දිනැතිව කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු වාර්තාව හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු කිරීමට නියමිතව ඇත<br>• කෑගල්ල,යාපනය,මාතලේ සංඛ්‍යාලේඛන අංශයන්හි ටැබ්ලට් පරිගණක අස්ථානගත වීම් වලට අදාළ මුළු අලාභ ශේෂ මුදල රු.236,403.00 වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර අවසන්ය.<br>• කොළඹ දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන අංශයේ නැතිවූ රු.15,000.00 ක සැම්සුන් මුද්‍රණ යන්ත්‍රය සඳහා පත්කළ කමිටු වාර්තාවේ නිර්දේශ පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.<br>• වාහන අනතුරු සඳහා ලැබිය යුතු අලාභය වන රු.232,275.00 රක්ෂණයෙන් අයකර ඇත.<br>• ඩිජිටල් ඩිස්ප්ලේ ඒකකය (රු.326,000.00) ගිනි ගැනීමෙන් වූ හානිය 2022 වර්ෂයෙහි පොතෙන් කපා හැර ඇත. |

## Training List -2023

| Name of the Training Pragramme(Sinhala) | Total Number of Trainees | Target | Participants | Dates |
|---|---|---|---|---|
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "ක්ෂේත්‍ර සං.නි. ගේ අත්දැකීම් හා මුහුණපාන අභියෝග" (online) | 85 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.01.09 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "දෙමළ මාධ්‍ය වැඩසටහන ශ්‍රමබල සමීක්ෂණ තිරසර සංවර්ධන දර්ශකාංක" (online) | 90 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.01.11 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "අභියෝග හමුවේ ඉදිරි දශකයේ දත්ත රැස්කිරීම" (online) | 94 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.01.16 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "ආපදා හා දේශගුණික විපර්යාස වලින් සංවර්ධන ක්‍රියාවලියට වන බලපෑම තක්සේරු කිරීමේදී DCS හි කාර්යභාරය" (online) | 96 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.01.23 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයක් ලද ජයග්‍රහනයක් - කුරුණෑගල" | 88 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.01.30 |
| Non-communicable diseases by Dr.Lalith Ekanayaka - Lanka Hospital | 186 | 186 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO/ICTO/ICTA/MSO/KKS | 2023.01.20 |
| ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව, ආර්ථික විද්‍යා අධ්‍යන අංශය- රුහුණු විශ්වවිද්‍යාලය | 50 | 100 | Students | 2023.01.19 |
| නායකත්වය, නිර්මාණශීලීත්වය සහ උපරිම කාර්ය සාධනය පිළිබඳ දේශනය | 103 | 103 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO/ICTO/ICTA/MSO/KKS | 2023.02.10 |
| ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාව, ගණිත අධ්‍යන අංශය- රුහුණු විශ්වවිද්‍යාලය | 160 | 160 | Students | 2023.02.16 |

| | | | | |
|---|---|---|---|---|
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "දෙමළ මාධ්‍ය වැඩසටහන සංගණන ඉතිහාසය හා 15 වන සංගණනය" | 44 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.02.01 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "Crypto curency and Blockchain හඳුන්වාදීම" | 100 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO/ICTO/ICTA/MSO/KKS | 2023.02.06 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "පාරිභෝගික මිල දර්ශක පාද වර්ෂ යාවත්කාලීන කිරීම" | 90 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.02.13 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "MRCB 2022 හඳුන්වාදීම දෙවන කොටස" | 95 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.03.27 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "දෙමළ මාධ්‍ය වැඩසටහන ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය" | 50 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.02.15 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "MRCB 2022 හඳුන්වාදීම" | 98 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.02.20 |
| දිස්ත්‍රික් අංඛ්‍යාලේඛන අංශවල නිලධාරීන් සඳහා Excel හා word පුහුණුව (සිංහල) | 55 | 55 | STN / SO / DO | 2023.02.21 |
| දිස්ත්‍රික් අංඛ්‍යාලේඛන අංශවල නිලධාරීන් සඳහා Excel හා word පුහුණුව (දෙමළ) | 23 | 23 | STN / SO / DO | 2023.02.21 |
| නවක සංවර්ධන නිලධාරී පුහුණුව | 37 | 37 | DO | 2023.02.28 |
| SPSS මෘදුකාංගය සම්බන්ධ මූලික පුහුණුව | 27 | 30 | STN / SO / DO | 2023.03.08,14,15,16,21, |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 49 | 50 | STN / SO / DO | 2023.03.14 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "DHS - සමීක්ෂණය හඳුන්වාදීම" | 100 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.02.27 |

| | | | | |
|---|---|---|---|---|
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - "කාර්යාල ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම" | 97 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.03.13 |
| නිල සංඛ්‍යාති / දර්ශකාංක පිළිබඳ දැනුවත් කිරීම - Mobile photography හඳුන්වාදීම" | 90 | 100 | DG / ADG / Director / DD / AD / SSTN / STN / SO / DO | 2023.03.20 |
| STATAපරිගණක මෘදුකාංගය භාවිතයෙන් දත්ත සංස්කරණය හා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ පුහුණු වැඩසටහන | 27 | 30 | STN / SO / DO | 2023.03.28` |
| දෙපාර්තමේන්තු කාර්භාරය පිළිබඳ දැනුවත් කිරීම - මහරගම අධ්‍යාපන විද්‍යාපීඨය | 29 | 29 | Students | 2023.04.03 |
| Tamil 200 Hrs Course (Online) | 100 | 100 | STN / SO /AD/ICTO/Principle/Medical Officers/Engineers/Exercise officers | 2023.05.20 |
| ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 31 | 31 | STN / SO / DO | 2023.05.23 |
| වාහන නඩත්තුව සම්බන්ධව දැනුවත් කිරීම සඳහා වන පුහුණු වැඩසටහන | 75 | 75 | DD/ STN / SO / DO/ICTO/ICTA/Drivers | 2023.06.14 |
| ප්‍රසම්පාදනය පිළිබඳව දැනුවත් කිරීම සඳහා වන පුහුණු වැඩසටහන | 68 | 70 | DD/ STN / SO / DO/ICTO/ICTA | 2023.07.06 |
| CS PRO පුහුණු වැඩසටහන | 30 | 30 | Director/AD/ICTO/ICTA | 2023.07.17-21 |
| යාපනය විශ්වවිද්‍යාලය ශිෂ්‍යයින් සඳහා -දෙපාර්තමේන්තු කාර්භාරය පිළිබඳ දැනුවත් කිරීම - | 61 | 65 | Students | 2023.07.27 |
| Qgis පිළිබඳව පුහුණු වැඩසටහන | 10 | 30 | DD/ STN / SO / DO | 2023.08.28 |
| R පිළිබඳව පුහුණු වැඩසටහන | 25 | 30 | DD/ STN / SO / DO | 2023.08.29 |

| | | | | |
|---|---|---|---|---|
| Small Area Estimation පිළිබඳ පුහුණු වැඩසටහන | 26 | 26 | DD/ STN / SO / DO | 2023.09.04 |
| ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අනුයුක්ත වූ නවක කළමනාකරණ සේවා (III) නිලධාරීන් සඳහා මූලික පුහුණු වැඩසටහන | 14 | 14 | MSO | 2023.11.27 -2023.12.01 |
| Data Management and Integrity Unit (DMIU) ස්ථාපිත කිරීම සහ NADA පද්ධතිය යාවත්කාලීන කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | 30 | DD/ STN / SO / DO/ICTO/ICTA | 2023.12.14 |
| ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා වන විශේෂ වැඩමුළුව - 2023 (දෙපාර්තමේන්තු කාර්භාරය පිළිබඳ දැනුවත් කිරීම) | 60 | 60 | Navy officers | 2023.12.15 |
| රියදුරන් සඳහා විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිතව රිය පැදවීම | 3 | 3 | Drivers | 28.02.2023 |
| Development of Digital Library Collection | 1 | 1 | Libraraian | 07.06.2023 |
| Two Days Work Shop on Python and Machine Learning - 2023 | 30 | 30 | DD/ STN / SO / DO | 2023.12.06-08 |
| **Total** | **2527** | **2798** | | |

DG - Director General
ADG -Aditional Director General
DD- Deputy Director
AD - Assistant Director
SSTN- Senior Statistician
STN - Stastician
SO - Statistical Officer
DO - Development Officer
ICTO - Information Communication Officer
ICTA - Information Communication Technology Assistant

MSO - Management Service Officer
OES - Office Establishment Service

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඩී.ඩී.ජී.ඒ. සෙනෙවිරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71, පොල්දූව පාර, බත්තරමුල්ල.

දෙපාර්තමේන්තුවේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

පළමු කොටස :- 71.00

| අනු අංකය | වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 1 | පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ප්‍රධාන ගබඩාවේ පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි. |
| 2 | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | 2023.12.31 දින වන විට යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. |
| 3 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබිණි. | හැකි සෑම අවස්ථාවකදීම විගණකාධිපති විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු සපයන ලදී. නමුත් 2021 වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැනවීම, කාර්යාල වසා තැබීම ආදී කරුණු නිසා නිලධාරීන් සේවයට පැමිණීම සීමා වීමෙන් සමහර අවස්ථාවල විගණකාධිපති විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රමාදයක් සිදු විය. කෙසේ වෙතත් රට යථා තත්ත්වයට පත් වූ වහාම අදාළ කටයුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ කර ඇත. |
| 4 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සංචරණ සීමා පැනවීම, ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශිය කාර්යාල වසා තැබීම, නිලධාරීන් සේවයට පැමිණීම සීමා වීම, තැපැල් ප්‍රමාදය ආදී කරුණු නිසා සමහර අවස්ථාවල අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ ප්‍රමාදයක් සිදු විය. කෙසේ වෙතත් රට යථා තත්ත්වයට පත් වූ වහාම අදාළ කටයුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ කර ඇත. |
| 5 | 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2022.04.22 හා 2022.05.23 දිනැතිව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| 6 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා වන නිර්දේශ ද අනෙකුත් | ඒ අනුව, ඌනතා, අතිරික්තතා හා සමීක්ෂණ මණ්ඩල නිර්දේශ සම්බන්ධව මේ වන විට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| | නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | |
| 7 | සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | 2023.12.31 දින වන විට ලීසිං වාරික ගෙවමින් පවතින ජීප් රථ 08 හැර ඉතිරි සියළුම දෙපාර්තමේන්තු වාහන සඳහා වාහන ලියාපදිංචි සහතික සන්තකයේ ඇත. |
| 8 | සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබිණි. | සංචිතයේ වාහන, වැටලීම් / නිරීක්ෂණ වාරිකා වලදී පූර්වයෙන් ඔත්තු ලැබීමේ ඉඩකඩ පවතින බැවින් දෙපාර්තමේන්තු සංචිත වාහන සියල්ලේම රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නැත. |
| 9 | වාහනයක් ගර්භිත වී මාස අටකට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | අපහරණය කිරීමට යෝජිතව තිබූ අතර 2021 වර්ෂයේ දී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය හා කෘෂිකර්ම අමාත්‍යාංශය යන ආයතන වෙත මෙම රථ ලබා දී ඇත. |
| 10 | සෑම වාහනයක් සඳහා ම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබිණි. | 2023.12.31 දින වන විට සෑම වාහනයක් සඳහාම ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ. |
| 11 | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබිණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩල මඟින් වාහන අනතුරු සම්බන්ධයෙන් නිසි කටයුතු සිදුකරමින් පවතී. |
| 12 | 2016.12.29 වන දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබිණි. | වාහන ඉන්ධන පරීක්ෂාව සඳහා යොමු වූවද කොරෝනා වසංගත තත්වය නිසා හා ඉන්ධන අර්බුදය නිසා පනවන ලද ඉන්ධන කෝත සීමා හේතුවෙන් ප්‍රායෝගිකව ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය.වර්තමානයේ දී ද ඉන්ධන කෝටාවට යටත්ව ඉන්ධන මිල දී ගැනීමට සිදු වී ඇති නිසා ප්‍රායෝගිකව ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට අපහසු තත්වයක් පවතී.කෙසේ වුවද ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි |
| 13 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දෙන ලද කරුණු යටතේ අනු අංක 02හි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම<br><br>***ජී.ඩී.ගුණසීලි මිය***<br>***ක.සේ.නි. I ශ්‍රේණිය***<br>***ණය ශේෂයේ වටිනාකම රු. 191,514.00***<br><br>ණය ශේෂය අග්‍රහාර රක්ෂණාවරණයෙන් අයකර ගැනීමට කටයුතු කරන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් 2023.05.17 දිනැතිව අග්‍රහාර රක්ෂණ භාර අරමුදල වෙත දන්වා ඇත. එයට පිළිතුරු ලෙස ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සභාපති විසින් එවන ලද 2023.09.04 දින අප වෙත ලැබී ඇති ලිපියට අනුව මෙම නිලධාරිනියගේ දේපල ණය මුදල පියවීම සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලට වගකීමක් නොමැති බව දන්වා ඇත. මේ සම්බන්ධව නැවතත් කරුණු පැහැදිලි කරමින් ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත 2023.09.20 දිනැතිව ලිපියක් යොමු කරන ලද |

| | | |
|---|---|---|
| | | අතර එම ලිපියෙන් මෙම නිලධාරිනියගේ දේපළ ණය අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිපති විසින් ලබා දී ඇති තීරණය දැනුම්දෙන ලෙස දන්වා ඇත.<br>ජාතික රක්ෂණ භාර අරමුදලේ තීරණය ප්‍රමාද බව දන්වා උපදෙස් සඳහා මුදල් ආර්ථික ස්ථායීකරණ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් වෙත 2023.10.27 දින ලිපියක් යොමු කර ඇත. තවද, මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් විසින් 2023.11.08 දිනැතිව ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ලිපියක් යොමු කරමින් මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඉදිරි කටයුතු සම්බන්ධයෙන් විමසීම් කර ඇත.<br><br>*එම්.ජී.ජිනසේන මයා*<br>*කා.සේ.සේ. III*<br>*ණය ශේෂයේ වටිනාකම රු. 146,380.00*<br><br>මෙම සේවක මහතා දෛනික සේවා පත්වීම ලබන විටද වයස අවු.45 ඉක්මවා ඇත. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංකයක් ලබා ගැනීම සඳහා යොමු කළ විට මෙම සේවක මහතා බඳවා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් ලබාදුන් අනුමැතියක් හෝ අමාත්‍ය මණ්ඩලය වෙතින් ලබාදුන් ප්‍රතිපත්තිමය තීරණයක් සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරන ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත. ඒ අනුව මේ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් කරුණු විමසා ඇති අතර, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් එම ගැටළුව ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. එම උපදෙස් ලද පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය.<br>2023.07.20 දින මේ සම්බන්ධව සිහි කැඳවීම් ලිපියක් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.<br>ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක කා.සේ.සේ./V14/J1309 හා 2023.09.12 දිනැති ලිපිය මඟින් මෙම ගැටළුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුවන බව දන්වා ඇත.<br><br>*එම්.ජී.ජේ.එස්. බණ්ඩාර මයා*<br>*කා.සේ.සේ. III*<br>*ණය ශේෂයේ වටිනාකම රු. 10,384.03*<br><br>ඇපකරුවන්ගෙන් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.<br>2023.11.30 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු. 10,384.03කි.<br><br>*වේලාපුරආරච්චි මයා*<br>*රියදුරු II*<br>*ණය ශේෂයේ වටිනාකම රු. 252,045.00*<br><br>හිඟ ණය ශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. තවද 2023.05.10 දිනැතිව මේ සම්බන්ධයෙන් සිහි කැඳවීමක් ද යොමු කර ඇත. 2023.08.17 දිනැතිවද සිහි කැඳවීමක් යොමු කරන ලදී. 2023.09.15 දින නීතිපති දෙපාර්තමේන්තුව මගින් පෞද්ගලික ලිපිගොනුවෙන් අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කරන ලෙස දුරකථනය මගින් දැනුම් දී ඇති අතර එම ලිපි ලේඛන 2023.09.20 දින |

| | | |
|---|---|---|
| | | යැවීමට කටයුතු කර ඇත. 2023.10.09 දිනද, නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති අප සතු තොරතුරු යොමු කර ඇත.<br>නීතිපති විසින් ඉල්ලා ඇති තොරතුරු නැවතත් 2023.11.28 දිනැතිව යොමු කර ඇති අතර, ණය මුදල් ගෙවන ලද වවුචරයෙහි/රිසිට්පතෙහි තොරතුරු අප සතුව නොමැති බවද දන්වා ඇත. පත්වීම් ලිපියෙහි සහතික කරන ලද පිටපතක් එවන ලෙස 2023.12.01 දින නැවත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත සිහිකැඳවීමක් යොමු කර ඇත.<br><br>***ඩබ්.ඒ.අයි.මධුශාන් මයා***<br>***ණය ශේෂයේ වටිනාකම රු. 148,000.00***<br><br>හිඟ ණය ශේෂ අයකර ගැනීමට නීතිමය පියවර ගැනීම සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා ඇති ලේඛණ 2023.05.10 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මේ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා 2023.08.28 දින නීතිපති දෙපාර්තමේන්තුවෙහි සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී අදාල නඩුව ගොනු කිරීම සඳහා තොරතුරු ලබා ගෙන ඇත. නීතිපති විසින් කැඳවා ඇති වාර්තාවකට පිළිතුරු යැවීම සඳහා නිලධාරියා සේවය කල අංශයෙන් තොරතුරු ගෙන්වා ගැනීම සඳහා ලිපි යොමු කර ඇත. සේවය කල අංශයෙන් ඉල්ලා ඇති නිවාඩු විස්තර මෙතෙක් ලැබී නොමැත.<br><br>***ඩී.පී.පී. මිල්රෝයි මයා***<br>***කා.සේ.සේ. I***<br>***ණය ශේෂයේ වටිනාකම රු. 120,847.94***<br><br>නඩුවේ වර්තමාන තත්වය විමසමින් 2023.08.28 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇත. 2023.10.30 දින නැවත සිහි කැඳවීමක් යොමු කර ඇත.<br>නීතිපති දෙපාර්තමේන්තුව විසින් එවන ලද 2023.11.06 දිනැති ලිපියෙන් මෙම සේවක මහතා වෙත නැවත සිතාසි නිකුත් කිරීම සඳහා අප විසින් යොමු කරන ලද 2023.02.01 දිනැති ලිපිය ඇමුණුමක් ලෙස අමුණා අධිකරණය වෙ තර ඇති බවත්, ඉදිරි දිනය අධිකරණය විසින් දැන්වූ විගස අප දැනුවත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.<br><br>***ආර්.එම්.වී.සෙව්වන්දි මිය***<br>***කා.සේ.සේ. III***<br>***ණය ශේෂයේ වටිනාකම රු. 132,891.25***<br><br>ණය ශේෂය 2022 අප්‍රේල් මස සිට මාසිකව රු.5000/- බැගින් ගෙවීම අනුමත කර ඇත. ඒ අනුව 2022.12.31 දින සිට ඉදිරියට මාස 22 ක් ඉතිරිව ඇත. මෙම නිලධාරිනිය නැවත සේවයේ පිහිටුවීමට අදාලව අභියාචනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර ඇගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි 2023.08.25 ගොනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට යොමු කර ඇත. මේ වන විට අයවිය යුතු ණය ශේෂය රු. 132,891.25 වේ. මේ දක්වා ගොනු ආපසු ලැබී නොමැත.<br>ඇයගේ අභියාචනය නිශ්ප්‍රභා කර ඇති අතර, පෞද්ගලික ලිපිගොනුව මේ දක්වා පාලන අංශය වෙත ලැබී නොමැත. |

<table>
<tr>
<td>14</td>
<td>පොදු තැම්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.</td>
<td>පොදු තැන්පත් ගිණුමේ පවතින කල් ඉකුත් වූ තැන්පතු පහත සඳහන් පරිදි ඉදිරිපත් කරමි.
<table>
<tr><th>තැන්පත් ගිණුම් අංකය</th><th>තැන්පත් කළ වර්ෂය</th><th>අංකය</th><th>මුදල (රු.)</th><th>වර්තමාන තත්ත්වය</th></tr>
<tr><td>6000-0-0-2-0-52</td><td>2017</td><td>GDTN 137</td><td>50,000.00</td><td>2023.06.16 නිරවුල් කර ඇත.</td></tr>
<tr><td></td><td>2018</td><td>GDTN 153</td><td>4,000.00</td><td>2022.02.23 නිරවුල් කර ඇත.</td></tr>
VI. ගිණුම් කටයුතු සම්බන්ධයෙන් වැරැදි නිවැරැදි කරන ආකාරය පිළිබඳව අදාළ උපදෙස් ලබා දෙන ලදී.

3. උත්සව අත්තිකාරම් හා විශේෂ අත්තිකාරම් ලේඛණය

ඔබ විසින් දක්වා ඇති නිරීක්ෂණ සමඟ එකඟ වේ. ඉදිරියේ දී අදාළ ලේඛන නඩත්තු කරන ආකාරය සම්බන්ධයෙන් අවශ්‍යය උපදෙස් සහ දැනුවත් කිරීම් සිදු කරන ලදී. අපැහැදි ශේෂයන් නැවත සටහන් කර නිවැරැදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

4. ඔබගේ නිරීක්ෂණය අනුව විශ්‍රාම ගිය නිලධාරී ඒ.ආර්. වික්‍රමතුංග මහතාගෙන් අයකර ගත යුතු නිවැරැදි ණය ශේෂය රු. 185,745/- ක් වන බවත්, එම ශේෂය ණය ලේඛනයේ සටහන් කිරීමේදී අත්වැරදීමකින් අදාළ නිලධාරිනිය විසින් එය රු. 189,745/- ක් ලෙස සටහන් කර ඇති බවත් දන්වා සිටින අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.

ආර්.එච්.ඩබ්. ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
தேசிய திட்டமிடல் திணைக்களம்
நிதி அமைச்சு
Department of National Planning
Ministry of Finance

මහලේකම් ගොඩනැගිල්ල (පළමු මහල), කොළඹ 01. செயலகம் (முதலாம் மாடி), கொழும்பு 01. The Secretariat (First Floor) Colombo 0

ඇමුණුම 3

මගේ අංකය / எனது இல / My No. NP/FD/GAR/17/2017/1
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2022.05.06

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
පොල්දූව පාර
බත්තරමුල්ල

<u>මූල්‍ය ප්‍රකාශන - ශීර්ෂය 237 - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ජාතික විගණන කාර්යාලය මගින් යොමු කරන ලද අංක TPD/C/NPD/FA/2021/06 හා 2022 අප්‍රේල් මස 07 දිනැති විගණන විමසුම හා බැඳේ.

1. ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා

(අ) අධි ඇස්තමේන්තු පිළියෙල කිරීම

I. කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන් දේශීය සහ ගෝලීය වශයෙන් ඇති වී ඇති තත්ත්වය තුළ රජයේ ආදායම අපේක්ෂිත මට්ටමට වඩා පහත වැටීමෙන් රජයේ අත්‍යවශ්‍ය පුනරාවර්තන වියදම් පවත්වා ගැනීම ප්‍රමාණවත් නොවීම හේතුකොට ගෙන 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්ෂික ඇස්තමේන්තුව තුළ එම වර්ෂය තුළ දැරීමට නියමිත වියදම් නැවත සමාලෝචනය කර අයවැය ප්‍රතිපාදන වලින් ඉතිරිකිරීමට අපේක්ෂිත ප්‍රතිපාදන පිළිබඳ වාර්තාවක් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලෙස අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක 21/1596/304/134 හා 2021.08.31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2021.09.08 දිනැති ලිපියට අනුව (ඇමුණුම 1) කරන ලද දැනුවත් කිරීම පරිදි පහත වැය විෂයයන් වල ප්‍රතිපාදන වැය නොකර ඉතිරිකිරීමට පියවර ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 237 – 1 – 2 – 0- 1102 (11) | 1,500,000 | - | 100% |
| 237 – 1 – 2 –-0 1205(11) | 100,000 | - | 100% |
| 237– 1 – 2 – -0 2401(11) | 1,300,000 | - | 80% |

කෙසේ වුවද, 237 -1 – 2 – 0 – 2401 (11) වැය විෂයය යටතේ කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කල අතර, රට තුළ පැවති කොරෝනා වසංගත තත්ත්වය තුළ බොහොමයක් කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් නොපැවති අතර ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලද අයකිරීමකින් තොරව සිදු කරන ලද පුහුණුවීම් සඳහා සම්බන්ධ වන ලදී. එසේම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සඳහා පැවැත්වෙන පුහුණු වැඩසටහනද එම වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කර තිබුණද රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පැවැත්වෙන එම පාඨමාලාව සඳහා 2021 වසරේ අප දෙපාර්තමේන්තුවට අවස්ථාවක් නොලැබීමද ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුවිය.

II. ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙම වැය විෂයයේ රු. 1,109,200 ප්‍රතිපාදනයද වියදම් නොකර ඉතිරිකිරීමට පියවර ගැනීම.

0094 11 248 4566 (Director General)
0094 11 248 4612 (Office)
0094 11 248 4613
ෆැක්ස් / தொலைநகல் / Fax 0094 11 244 8063, 0094 11 243 1620
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / Email / Web page: dgnp@npd.treasury.gov.lk www.npd.gov.lk

III. ලෝක ආහාර වැඩසටහන යටතේ රු. 300,000,000 ක ප්‍රතිපාදන ප්‍රතිපාර්ශවීය අරමුදල්/ප්‍රතිරූපක අරමුදල් වශයෙන් ලබා දී ඇති අතර, මෙය මු.රෙ. 615 අනුව වෙළඳ ද්‍රව්‍ය ආධාර සැපයුම් ආදියේ විදේශ විනිමය පිරිවැය පියවා ගැනීම සඳහා සපයන ලද පහසුකමකි. ඒ අනුව ලෝක ආහාර වැඩසහනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් මෙම පහසුකම ලබා දී නොමැති බැවින් මෙම ප්‍රතිපාදන ඇති විදේශ ආධාර අදාළ වැය විෂයයන් යටතේ මූල්‍යකරණ අංක 13 ට අදාළ ලෝක ආහාර වැඩසටහන හා PALAMA Project යටතේ මාරු කරන ලදී.

IV. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1596/304/134 වූ රාජ්‍ය වියදම් සමාලෝචනය යන මැයෙන් මුදල් අමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති 2021.08.28 දිනැති සංදේශය හා අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අප දෙපාර්තමේන්තුවේ ඉතිරි කිරීම් පහත සඳහන් වන අතර, එම ඉතිරිකිරීම් ගැලපීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදන ඉතිරිවීම් පහත පරිදි වෙනස් වේ.

| වැය විෂයය | ශුද්ධ ප්‍රතිපාදනය<br>1 | භාණ්ඩාගාර මුද්‍රිත අනුව ඉතිරිය<br>2 | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉතිරිකිරීම්<br>3 | දෙපාර්තමේන්තුවේ සත්‍ය ප්‍රතිපාදන ඉතිරිය<br>4<br>(2-3) | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 237-1-1-0-1002 | 3,500,000 | 1,958,691 | 1,958,691 | - | |
| 237-1-1-0-1101 | 700,000 | 313,957 | 313,957 | - | |
| 237-1-1-0-1402 | 4,500,000 | 1,403,606 | 1,390,800 | 12,806 | 0.28% |
| 237-1-1-0-1404 | 65,000 | 24,273 | 24,273 | - | |
| 237-1-1-18-2509-12 | 3,068,402,610 | 929,730,978 | 681,469,000 | 248,261,978 | 8% |
| 237-1-1-18-2509-17 | 2,500,000 | 1,547,152 | 1,547,152 | - | |
| 237-1-2-0- 1002-11 | 1,500,000 | 1,116,295 | 1,074,108 | 42,187 | 3% |
| 237-1-2-0- 1003-11 | 10,000,000 | 2,871,097 | 2,733,465 | 137,632 | 1% |
| 237-1-2-0- 1101-11 | 200,000 | 126,550 | 126,550 | - | |
| 237-1-2-0- 1201-11 | 2,000,000 | 890,549 | 890,549 | - | |
| 237-1-2-0- 1301-11 | 800,000 | 419,473 | 419,473 | - | |
| 237-1-2-0- 1401-11 | 100,000 | 97,800 | 97,800 | - | |
| 237-1-2-0- 1402-11 | 2,000,000 | 1,408,663 | 1,408,663 | - | |
| 237-1-2-0- 1403-11 | 4,000,000 | 2,588,447 | 2,588,447 | - | |
| 237-1-2-0- 1409-11 | 2,700,000 | 1,290,273 | 1,290,273 | - | |
| 237-1-2-0- 1506-11 | 1,200,000 | 920,712 | 920,712 | - | |
| 237-1-2-1- 2506-11 | 2,250,000,000 | 604,382,477 | - | 604,382,477 | 27% |
| 237-1-2-3- 2506-11 | 8,000,000,000 | 2,695,088,748 | 2,600,000,000 | 95,088,748 | 1% |

1. 237-1-2-1-2506 (11) රු. 604,382,477

| | | | |
|---|---|---|---|
| මුළු ප්‍රතිපාදන | | රු. | 2,250,000,000 |
| මුළු වියදම | රු. 1,645,575,781 | | |
| අතැති බිල්පත් | රු. 470,075,746 | | |
| ඇස්තමේන්තුගත මුළු වියදම | 2,115,651,527 | | (2,115,651,527) |
| ඉතිරිය | | | **134,348,473** |

ඉහත පරිදි 2021 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා දරණ ලද වියදම් වලට අවශ්‍ය අක්මුදල් භාණ්ඩාගාරයෙන් නොලැබීම මත ගෙවීම් කිරීමට නොහැකි වීම නිසා රු. මිලියන 470 පමණ අතැති බිල්පත් ඉතිරිවී ඇත. ඒ අනුව, මුළු ප්‍රතිපාදනයෙන් 5.97% ප්‍රතිශතයක් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව නිරීක්ෂණය කරමි.

2. **237-1-2-3-2506 (11)**

| | | |
|---|---|---|
| මුළු ප්‍රතිපාදන | රු. | 8,000,000,000 |
| මුළු වියදම | රු. | (5,304,876,602) |
| අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉතිරිකිරීම | රු. | (2,600,000,000) |
| ඉතිරිය | | **95,123,398** |

ඒ අනුව, මුළු ප්‍රතිපාදනයෙන් 1% ප්‍රතිශතයක් ප්‍රතිපාදන ඉතිරිවිය.

3. **237-1-1-18-2509 (12)**

**කොවිඩ් 19 සඳහා වන අවිනිශ්චිත හා හදිසි ප්‍රතිචාර සංරචක (CERCs) ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී අවසන් වීමට නියමිත බැවින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් ප්‍රායෝගික ගැටළු හේතුවෙන් අපේක්ෂා කල පරිදි වියදම් සිදු නොවුනි.

I. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතන 05 ක් පවතින අතර, ඒවා මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති ක්‍රියාකාරකම් රටතුළ පවතින ආර්ථික අර්බුද හේතුවෙන් ඇතිවූ ප්‍රමාදයන් හා

II. පවතින මූල්‍යමය තත්ත්වය හේතුවෙන් ණයවර ලිපි විවෘත කර ගැනීමට ඇති අපහසුතාවය සහ දේශීය අමුද්‍රව්‍ය නොමැති වීමෙන් අපේක්ෂිත ඉදිකිරීම් සිදු කිරීමට නොහැකි වීමයි.

V. ඒ අනුව, ඉහත සඳහන් පරිදි රාජ්‍ය වියදම් සමාලෝචනය අමාත්‍ය මණ්ඩලයේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමේදී දැනට දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය රාජ්‍ය සේවා සහ සංවර්ධන වැඩසටහන් බාධාවකින් තොරව පවත්වා ගනිමින් හා 2021 වර්ෂය තුළ ලබා දී ඇති ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම කළමනාකරණය කර ගැනීම තුලින් රට මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතා හමුවේ වඩාත් විචක්ෂණශීලීව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බැවින් මෙම වැය විෂයයන් සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා නොගෙන මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන අත්‍යාවශ්‍ය වැය විෂයයන් සඳහා මාරු කර ගැනීමට කටයුතු කිරීම.

(ආ) ඌන ඇස්තමේන්තු පිළියෙල කිරීම

I. **වැය විෂයය අංක 237-1-1-0-1201(11)**

දෙපාර්තමේන්තුවේ ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා වෙනුවෙන් වර්ෂය සඳහා වෙන්කර ගත් ප්‍රතිපාදන, භාණ්ඩ ආනයනය සීමා කිරීම හේතුවෙන් වෙළඳපොළ භාණ්ඩ හිඟවීම නිසා අත්‍යාවශ්‍යව පැවති ටෝනර් සහ කාර්යාල ලිපිද්‍රව්‍ය සපයා ගැනීමට සිදුවීමත් එම භාණ්ඩවල මිළ ඉහල යාමත් හේතුවෙන් වෙන්කර ගත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

ඉහත තත්ත්වයන් පසුව ඇති වූ බැවින් ප්‍රතිපාදන ඌනතාවයක් ඇති වූ බව සඳහන් කරමි.

**වැය විෂයය අංක 237-1-1-0-1409 (11)**

රජයේ ආයෝජන සැලැස්ම මුද්‍රණ කටයුතු සඳහා ඇති වූ වියදම වෙළඳපොල මිළ උච්ඡාවචනයන් හේතුවෙන් අපේක්ෂිත තත්ත්වය ඉක්මවායාම නිසා ප්‍රතිපාදන ඌනතාවයක් ඇති විය.

**වැය විෂයය අංක 237 -1 -1 – 2001 (11)**

ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී පැවති මිළ ගණන් වලට වඩා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා යොදා ගනු ලබන භාණ්ඩවල මිළ ගණන් සීඝ්‍රයෙන් ඉහළ යාම මත ඇස්තමේන්තු වෙනස්වීම හේතුවෙන් ප්‍රතිපාදන ඌනතාවයක් සිදු වී ඇත.

**වැය විෂයය අංක 237-1-2-2-2202 -13**

ලෝක ආහාර වැඩසටහන යටතේ විදේශ ආධාර වශයෙන් ලැබෙන ද්‍රව්‍යමය හා මුදලින් ලැබෙන ආධාර මූල්‍යකරණ අංක 16 යටතේ මු.රෙ. 615 අනුව ගිණුම් ගතකල නොහැකි බැවින්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි රු. 158,086,192 ක ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය තුළම මාරු කරන ලද අතර, ඌන ඇස්තමේන්තු පිළියෙල කිරීමක් නොවන බව පෙන්වා දෙමි.

**වැය විෂයය අංක 237-1-2-4-2506 -13**
**වැය විෂයය අංක 237-1-2-4-2506 -17**

ඇමෙරිකා එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් McGovern – Dole Food for Education Programe යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳපොල සන්ධානය (PALAM/A) ව්‍යාපෘතිය ඇමෙරිකානු ආධාර මත Save the Children සංවිධානය මඟින් මෙම ව්‍යාපෘතිය දේශීයව අධ්‍යාපන අමාත්‍යාංශය හා සෞඛ්‍යය අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර, 2021 වර්ෂයේ මෙම වැඩසටහන යටතේ මෙරටට ගෙන්වීමට සැලසුම් කරන ලද ද්‍රව්‍ය ආධාර ප්‍රමාණයට වඩා වැඩි ආහාර ප්‍රමාණයක් ගෙන්වීමට කටයුතු කරන ලදී. මේ නිසා රජය වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් ප්‍රමාණය (17) ඉහළ යන ලදී. මේ සමගම මෙම ද්‍රව්‍ය ආධාර වල වෙළඳපොල වටිනාකම ඉහළ යාම හා රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ වටිනාකම අධිප්‍රමාණය වීම නිසා ද්‍රව්‍ය වටිනාකම (13) ඉහළ යන ලදී.

II. මෙමඟින් දක්වා ඇති වැය විෂයයන් සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද අවස්ථාවේදී ප්‍රතිපාදන සලසා ගැනීමේ අවශ්‍යතාවයක් නොවුනි. 2021 වර්ෂයේ ආරම්භයේදී මෙම දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී පැමිණි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරයෙකුගේ ඒ වන විටත් මෙමෙහයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන තිබූ නිල වාහනයක වාරික ගෙවීමට සිදු වීම හේතුවෙන් 237-1-1-0-1408 (11) යටතේ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට සිදු වූ අතර, අධ්‍යක්ෂවරියක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරනු ලැබූ නවත් නිලධාරිනියක වෙනුවෙන්, ඒ වන විටත් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන තිබූ නිල වාහනය සඳහා වාරික සහ පොළී ගෙවීම සඳහා වැය විෂයය අංක 237-1-1-0-1406 සහ 237-1-1-0-2108 යටතේ අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට සිදුවිය.

2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

I. ලෝක ආහාර වැඩසටහනට අදාළව මෙම දෙපාර්තමේන්තුව විසින් රු. 1,098,451,879 ක මුදලක් ගිණුම් ගත කරන ලද අතර, ඉතිරි රු. 563,945,012 අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දරණ ලද වියදම් වේ.

II. මුදල් රෙගුලාසි 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දරණ ලද වියදම්වල එකතුව ඒ.සී.ඒ. (ii) ආකෘතියට අනුව,ඉංග්‍රීසි භාෂාවෙන් සකසන ලද අවසාන ගිණුම තුළ දක්වා ඇති අතර, සිංහල භාෂාවෙන් සකසන ලද මූල්‍ය ප්‍රකාශනයේ අත්වැරදීමකින් එම අගය මැකී තිබුණි.

III. ලෝක ආහාර වැඩසටහනට අදාළව රු. 563,945,012 ක වියදම් දැරීම සඳහා අප දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත නිදහස් කිරීමෙන් අනතුරුව එම ප්‍රතිපාදන සඳහා සෘජුව අක්මුදල් ලබාගෙන වියදම් කර ගිණුම් ගත කරන බැවින්, ඒ අනුව මෙම වියදම දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අප දෙපාර්තමේන්තුව වෙනුවෙන් දරන ලද වියදමක් බැවින් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අඩුකර දක්වා ඇත. ඒ අනුව මු.රෙ. 208 යටතේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සඳහා නිදහස් කරන ප්‍රතිපාදන සඳහා මෙම දෙපාර්තමේන්තුවට අක්මුදල් ලබා නොගන්නා බව දන්වමි.

3. මූල්‍ය නොවන වත්කම්

I.

| | නිවාස | කාර්යාල උපකරණ | පරිගණක උපකරණ | විදුලිත් උපකරණ | සන්නිවේදන උපකරණ | ගෘහභාණ්ඩ | පොත්පත් හා සඟරා උපකරණ | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 2020.දෙසැම්බර් 31 දිනට ශේෂය | - | 2,290,294 | 21,994,100 | 4,029,657 | 346,812 | 4,786,351 | 4,023,706 | 37,470,920 |
| 2021 ජනවාරි 01 දිනට ශේෂය(-) | 33,810,000 | 2,109,853 | 20,395,301 | 4,046,705 | 385,662 | 5,141,166 | 4,023,706 | 69,912,393 |
| වෙනස | **(33,810,000)** | **180,441** | **1,598,799** | **(17,048)** | **(38,850)** | **(354,815)** | **-** | **32,441,473** |
| එකතු කරන ලද ආරම්භක ශේෂය | - | 801,888 | 1,113,450 | - | 2,500 | 141,656 | 268,178 | 2,327,672 |
| ලපිම් සිදුකල ආකාරය | | | | | | | | |
| වර්ෂය තුළ මිලදී ගැනීම් (-) | - | 801,888 | 348,157 | - | 2,500 | 141,656 | 268,178 | 1,562,379 |
| වර්ෂයතුළ අත්පත් කර ගැනීම(-)(Tr in) | | | 494,787 | 17,048 | 38,850 | 354,815 | | 905,500 |
| වර්ෂය තුළ මාරු කිරීම්/විනාශ කිරීම් (-) | - | (180,441) | (1,598,799) | - | - | - | - | (1,779,240) |
| වැරදි නිවැරදි කිරීම (-) | | | 270,506 | | | | | 270,506 |
| නිවාස වටිනාකම | 33,810,000 | | | | | | | 33,810,000 |
| | **33,810,000** | **621,447** | **(485,349)** | **17,048** | **41,350** | **496,471** | **268,178** | **34,769,145** |

ඉහත සඳහන් වගුවේ සඳහන් පරිදි වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද පහත සඳහන් ගණුදෙනු ආරම්භක ශේෂයන්ට ගලපා SA 82 භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශය නිකුත් කර ඇත.

නිලනිවාස අගය 33,810,000

| | |
|---|---|
| වත්කම් අත්පත්කර ගැනීම | 1,562,379 |
| වත්කම් මාරු කිරීම (In) | 905,500 |
| වත්කම් මාරුකිරීම(Out) | (1,779,240) |
| වැරදි නිවැරදි කිරීම් | 270,506 |
| | **34,769,145** |

2019 දෙසැම්බර් මස 31 දිනට සඳහන් කර ඇති ශේෂයන් 2020 දෙසැම්බර් 31 දිනට පවතින ශේෂයන් බවට හා 2020 ජනවාරි 01 දිනට සඳහන් කර ඇති ශේෂයන් 2021 ජනවාරි 01 දිනට පවතින ශේෂයන් බවට නිවැරදි විය යුතුය.

ඒ අනුව,

I. වර්ෂය තුළ මිලදී ගනු ලබන සියළුම වත්කම් වලට අදාළව සිදුවන ගණුදෙනුව හැර අනෙකුත් සියළු ගණුදෙනු එනම්, තක්සේරු කරන ලද වටිනාකම් ගිණුම්ගත කිරීම් (උපචිත පදනම යටතේ ගිණුම් තැබීම සඳහා මෙම දෙපාර්තමේන්තුව සතුව පවතින ගොඩනැගිලි වල තක්සේරු කරන ලද වටිනාකම ගිණුම්වලට ඇතුළත් කිරීම සඳහා 2021.08.20 දින ලද වටිනාකම වන රු. 33,810,000) වර්ෂය තුළ දී ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම්, ස්ථාවර වත්කම් පවරාදීම හා වර්ෂය තුළ සිදු කරන වැරදි නිවැරදි කිරීම් යන සියළුම ගණුදෙනු සිගාස් වැඩසටහන මගින් ගිණුම්ගත කිරීමේදී, ආරම්භක ශේෂයන්ට ගැලපීම සාමාන්‍ය ක්‍රමවේදයක් වන බව තවදුරටත් පෙන්වා දෙමි.

II. වර්ෂය තුළ අප දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගන්නා ලද ස්ථාවර වත්කම් වල වටිනාකම වූ රු. 1,562,379 ක මුදල අප විසින් නිවැරදිව සිගාස් වැඩසටහන තුළ ගිණුම් ගත කර ඉදිරිපත් කලද, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA -82 ප්‍රකාශයේ එම වටිනාකම ආරම්භක ශේෂ ලෙස දක්වා ඇති අතර, එය මෙම SA -82 භාණ්ඩාගාර මුද්‍රිත සටහන් පත්‍රයේ සිදු වී ඇති වැරද්දක් බව පෙන්වා දිය හැක. ( මෙම දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කිරීමෙන් අනතුරුව සිගාස් වැඩසටහන යටතේ අප දෙපාර්තමේන්තුව විසින් ලබා ගත් මුද්‍රිත සටහන අමුණා ඇත.) (ඇමුණුම 02)

4. බැරකම් පිළිබඳ ප්‍රකාශය
---

i. 2022 වර්ෂය වෙනුවෙන් විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ පවතින බිල්පත් ගෙවීම් කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව තුළ ප්‍රතිපාදන වෙන්කර දී නොමැති අතර, මෙම ගෙවීම් කිරීම සඳහා අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්ගේ වැය විෂය යටතේ වෙන්කර දී ඇති අතර, අදාළ දිස්ත්‍රික් ලේකම්ගේ වැය විෂයයන් යටතේ 2021.12.31 දිනට නොපියවූ බිල්පත් ලෙස රු. 470,075,446.17 ක් වාර්තා කර ඇත.
ලෝක ආහාර වැඩසටහන යටතේ මන්නාරම් දිස්ත්‍රික්කයට අදාළ රු. 6265 ක බැරකම් වේ.

ii. රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/2 හා 2021.10.26 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ප්‍රකාරව 2021 වර්ෂයට අදාළව බැඳීම් හා බැරකම් සිගාස් වෙබ් යෙදුම වෙත උඩුගත කල නමුත් භාණ්ඩාගාර SA -92 සමුච්චිත බැරකම් වාර්තාවේ සඳහන් ව නොමැතිවීම පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් වාචිකව විමසීම කරන ලද අතර, එය තාක්ෂණික දෝෂයක් හේතුකොටගෙන මෙම වාර්තාවේ සඳහන් වී නොමැති බව දන්වන ලදී.

iii. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක iii යටතේ බැඳීම් හා බැරකම් යටතේ ඇතුළත් කර ඇති වටිනාකම වන රු. 135,480 ක මුදල නිවැරදි වන අතර, බැරකම් ලේඛනයේ ඇතුළත් බැරකම්වල එකතුව ද ඒ අනුව නිවරැදි වේ. බැරකම් ලේඛනයේ එකතුව දැක්වීමේදී ලියා ඇති ඉලක්කම පමණක් නිවැරදි විය යුතු අතර, එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. තවද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කිරීමට නියමිතව තිබූ, මෙම දෙපාර්තමේන්තුවට අදාළ වන රු. 13,400 ක අපේක්ෂිත බැරකමක් පැවැති අතර, එය බැරකම් ලේඛනයේ පිටු අංක 16 හි ඇතුළත් කර ඇත.

(134)

5. බැංකු සැසඳුම්

මුදල් රෙගුලාසි 396 (ආ) හා (ඇ) පරිදි කටයුතු කර ඇති මගේ සමාංක NP/FD/Bank/66 2021.10.14 හා 2021.12.20 දිනැති ලිපි මගින් මෙම ආදායකයාට ලියාපදිංචි තැපැල මගින් දැනුම් දී ඇත. එම ලිපි පිටපත් මේ සමඟ අමුණා ඇත.(ඇමුණුම 03 සහ 04) තවද මු.රෙ. 396 (ඇ) පරිදි ඊට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

6. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මුදල් පොත 2021 දෙසැම්බර් 31 දිනට තුලනය කර භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල අතපසුවීමකින් පෙර වර්ෂයේ සඳහන් කල පරිදිම 2021 වර්ෂයේ දී ද මුදල් හා මුදල් සමාන ද හි ශේෂයට ඇතුළත් කරන ලද අතර, 2021 නොවැම්බර් මස 26 දිනැති 2021/03 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 7.9 ඡේදය පරිදි එය ඉවත්කර, නිවැරදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කරමි. (ඇමුණුම 05)

7. අග්‍රිම ගිණුම

1. මෙම දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂය සඳහා අග්‍රිම සැලසුම 2020.10.14 දිනැතිව නිකුත් කරන භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 4හි සඳහන් උපදෙස් පරිදි 2021 වර්ෂයට අදාළ අග්‍රිම සැලසුම පිළියෙල කර ඇත. ඒ අනුව අග්‍රිම සැලසුම පිළියෙල කිරීමේදී පහත සඳහන් ගණුදෙනු සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන ගැලපීමෙන් අනතුරුව පිළියෙල කරන ලබයි.
   a) මුදල් රෙගුලාසි 208 අනුව මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හෝ දිස්ත්‍රික් කාර්යාල විසින් කරනු ලබන ගෙවීම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන
   b) හරස් සටහන් මගින් සිදුවන ගණුදෙනු (මුදලින් නොවන සියළුම ගණුදෙනු)

ඒ අනුව, අග්‍රිම සැලසුම දෙපාර්තමේන්තුවේ ශීර්ෂ අංක 237 යටතේ ලබාදී ඇති මුළු ප්‍රතිපාදන වලින් ඉහත සඳහන් ගණුදෙනු හැර ලබා දී ඇති මුළු ප්‍රතිපාදන සඳහාම සකස් කරන අතර, ඒ ඒ මාස වලදී ඉල්ලුම් කරන ප්‍රතිපාදන පහත සඳහන් පරිදි දෙපාර්තමේන්තුවේ පාලනයට පරිබාහිරව සිදු වූ,

   a) කොරෝනා වසංගත තත්ත්වය හමුවේ 2021 වර්ෂයේදී ද කාර්යාල වසා දැමීම හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ එදිනෙදා වියදම් අඩුවීම ප්‍රායෝගික හේතු මත වෙනස් විය.
   b) කොවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑම හේතුවෙන් දේශීය සහ ගෝලීය වශයෙන් ඇති වී ඇති තත්ත්වය තුළ රජයේ ආදායම අපේක්ෂිත මට්ටමට වඩා පහත වැටී තිබීම හේතුවෙන් 2021.08.28 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 21/1596/304/134 වූ රාජ්‍ය වියදම් සමාලෝචනය මැයෙන් මුදල් ඇමතිවරයා නිකුත් කරන ලද සංදේශය පරිදි දෙපාර්තමේන්තුවේ වියදම් පාලනය කිරීම.ඒ අනුව වර්ෂය ආරම්භයේදී (2021.01.01) සකස් කරන ලද අග්‍රිම සැලැස්ම ප්‍රකාරව අග්‍රිම සඳහා ඉල්ලුම් නොකරන ලදී.

2. මෙම දෙපාර්තමේන්තුවට ඒ ඒ මාසවලදී අවශ්‍ය වන අත්මුදල් අවශ්‍යතාවය සඳහා අග්‍රිම ඉල්ලුම්පත්‍රය සෑම මසකම පළමු සතිය තුළ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන අතර, පහත සඳහන් ගණුදෙනු සඳහා අත්මුදල් අවශ්‍යතාවය මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසුව ලද අතර, ඒවා ITMIS පද්ධතිය හරහා online ඉල්ලුම් කර මුදල් ලබා ගන්නා ලදී. ඒ අනුව PALAMA ව්‍යාපෘතිය යටතේ විදේශ ආධාර වශයෙන් ලද ද්‍රව්‍යමය ආධාර ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා ඔක්තොබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා ලබා ගත් මුදල රු. 48,382,600 හා ඉතිරි මුදල් ජනවාරි හා දෙසැම්බර් මස පුනරාවර්තන වියදම් සඳහා ගිණුම් අංශයට ලද වවුචර්පත් ITMIS පද්ධතිය හරහා ලබා ගන්නා ලද මුදල් වේ.

ආර්.එච්.ඩබ්.ඒ. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්

(55)

ඇමුණුම 4


ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
தேசிய திட்டமிடல் திணைக்களம்
நிதி அமைச்சு
**Department of National Planning**
**Ministry of Finance**

ප්‍රාදේශීය සංවර්ධන අංශය | பிரதேச அபிவிருத்தி பிரிவு | Regional Development Division

'මිලෝදා',පළමු මහල,බ්‍රිස්ටල් වීදිය,කොළඹ 01, 'மிலோதா', 1ம் மாடி, பிரிஸ்டல் வீதி, கொழும்பு-01.'Miloda',1st Floor, Bristol Street,Colombo 01.


මගේ අංකය / எனது இல / My No: MF/NPD/AD-02/Elect.Bill/Gen.
ඔබේ අංකය / உமது இல / YourNo: TPD/C/NPD/2021/02
දිනය / திகதி / Date: 2022.05.26

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

ජී. එන්. කුමාරි මහත්මියගේ අවධානයට

**<u>ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අනුබද්ධ ප්‍රාදේශීය සංවර්ධන අංශයට අදාළ විදුලි ගාස්තු හා ජල ගාස්තු ගෙවීම සම්බන්ධව විගණන පරීක්ෂාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2022 ජනවාරි 26 දිනැති විගණන විමසුම හා බැඳේ.

මිලෝදා ගොඩනැගිල්ලේ පළමු මහලේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාදේශීය සංවර්ධන අංශය ස්ථාපිත කර ඇත. මෙම අංශය ස්ථාපිත කරන ලද 2020 සැප්තැම්බර් මස සිට 2020 දෙසැම්බර් මස දක්වා ගෙවීම් කිරීමට පදනම ලෙස එතෙක් පැවැති ක්‍රමයට අනුව 2015 ජනවාරි මස බිල්පත් පදනම් කර ගනිමින් ගෙවිය යුතු මුදල් එවකට පැවති අමාත්‍යාංශය විසින් ගෙවා ඇත.

2021 වසරේදි නිලධාරින්ගේ අඩු වැඩිවීමක් හෝ රාජකාරි වල විශේෂ වෙනසක් සිදුවී නොමැති අවස්ථාවක වුවද, 2021 පෙබරවාරි මාසයේ සිට විදුලි බිල්පත් හා ජල බිල්පත් විශාල වැඩිවීමක් පෙන්නුම් කළ අතර, එසේම කොරෝනා වසංගත තත්වය හේතුවෙන් කාර්යමණ්ඩලය සීමා කර ගෙන්වූ අප්‍රේල් ,මැයි මාස වලද ජල හා විදුලි බිල්පත් විශාල ලෙස වැඩිවීම හේතුවෙන් මේ පිළිබඳව සොයා බලා සාධාරණ විසඳුමක් ලබා දෙන ලෙස මිලෝදා ආයතනයට දැනුම් දෙන ලදී.

මෙසේ වැඩි මුදලක් ගෙවීම සාධාරණ නොවන බව පෙනී යන හෙයින් පළමු මහලේ ජල හා විදුලි බිලපත් සඳහා පෙර ගෙවන ලද අගයන් අනුව පොදු අගයක් තීරණය කිරීම හෝ (Flat rate) වෙනත් සාධාරණ ක්‍රමවේදයක් අනුගමනය කොට මාසික අගයක් තීරණය කිරීමට අවශ්‍ය කටයුතු යොදන මෙන් ඉල්ලා මිලෝදා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි වෙත ලිපියකින් දැනුම් දී ඇත. (ලිපියෙහි පිටපතක් අමුණා ඇත)

එම ලිපියට පිළිතුරු ලෙස එවන ලද ලිපියේ ජල හා විදුලි බිල්පත් වල වටිනාකමින් වැඩි කොටසක් වැය වන්නේ මධ්‍යගත වායු සමීකරණ යන්ත්‍රය සඳහා බවත්, සීමිත කාර්යමණ්ඩලයක් සඳහා වුව ද මධ්‍යගත වායු සමීකරණ යන්ත්‍රය එසේ පිරිස් අනුව කළමනාකරණය කර ගැනීමේ හැකියාව ඉතා සීමිත අගයක් ගන්නා බැවින් නිලධාරින් සුළු පිරිසක් රාජකාරි කටයුතු වල නිරත වුවත් එම මහල සඳහා එකම විදුලි ධාරිතාවක් වැය වන අතර මධ්‍යගත වායු සමීකරණ යන්ත්‍රය ක්‍රියා කිරීම ආරම්භයේ සිට අවසන් වන තෙක්ම ඒ සඳහා ජල හා විදුලිය වැය වීම සිදු වන බව මිලෝදා ආයතනය විසින් දන්වා ඇත. ( ලිපියේ පිටපතක් අමුණා ඇත )


දුරකථන / தொலைபேசி / Telephone: 011- 2322867, 011-2484566
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2244636, 011- 2448063
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: dgnp@npd.treasury.gov.lk

මේ පිළිබඳව ප්‍රධාන විධායක නිලධාරි සමග කරන ලද සාකච්ඡාවේදී ජල හා විදුලි බිල්පත් සඳහා 2015 ජනවාරි මස බිල්පත් පදනම් කරගෙන ගණනය කිරීම සාධාරණ නොවන බව පෙන්වා දුන් අතර, මේ පිළිබඳව මිලෝදා ආයතනය දැනට ක්‍රියාත්මක වන ආරක්ෂක අමාත්‍යාංශය සමග ඉදිරි දිනකදී පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල හමුවට මෙම කාරණය ඉදිරිපත් කර පිළිතුරු ලබා දෙන බව දන්වා ඇත. එතෙක් පෙර ගෙවූ ක්‍රමයටම බිල්පත් නිරවුල් කරන ලෙසත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව වැඩිපුර ගෙවා ඇති යම් මුදලක් වෙතොත් ඉදිරි බිල්පත් වලින් අඩු කර ගැනීමට කටයුතු කරන බව ප්‍රධාන විධායක නිලධාරි විසින් දැනුම් දී ඇත.

එහෙත් අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ ලිඛිත උපදෙස් පරිදි ඉදිරියේදි අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලබා දෙන තුරු බිල්පත් අසාමාන්‍ය ලෙස වැඩි වීමට පෙර ගෙවූ මුදල ද සලකා බලා පෙබරවාරි මස සිට විදුලිය සඳහා මසකට රු.125,000/- ක මුදලක් සහ ජලය සඳහා මාර්තු මස සිට රු. 15,000/- ක මුදලක් ගෙවීමට තීරණය කර ගෙවා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පිළිබඳව කිහිප වතාවක්ම දූරකථනයෙන් විමසීමේදී තවමත් රැස්වීම පවත්වා තීරණයක් ගෙන නොමැති බව දන්වා ඇත. මහල් සයකින් යුතු මිලෝදා ගොඩනැගිල්ලේ පළමු මහල හැර සෙසු මහල් 5 ම මිලෝදා ආයතනය විසින් පරිහරණය කරනු ලබන අතර, එම ආයතනයේ විදුලි පරිභෝජනය අනුව බිල් වැඩිවී ඇත. එම වැඩි වීම සම්බන්ධයෙන් මෙම අංශයට වගකීමක් ගත නොහැකි අතර මෙම අංශයට අදාළව බිල වැඩිවීම හේතුවෙන් මිලෝදා ආයතනයට ඉහත සඳහන් පරිදි දැනුම් දී එය අඩුකර ගෙවීමට කටයුතු කර ඇත.

කෙසේ වුවද, පෙර ගෙවූ ක්‍රමයට ගෙවීම් සිදු කළේ නම්, මිලෝදා ආයතනයේ විදුලි පරිභෝජනයේ වැඩිවීම අප අංශයට ගෙවීමට සිදුවන බැවින්, මෙම ගෙවීම් ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් රජයට විශාල මුදලක් ඉතිරි වී ඇත.

තවද අංක 02 යටතේ ඔබගේ නිරීක්ෂණ අනුව, ප්‍රාදේශීය සංවර්ධන අංශය 2020 දෙසැම්බර් තෙක් මුදල් අමාත්‍යාංශය යටතේ පැවතියද, 2021 වසරේ සිට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ පවතී. එබැවින් ප්‍රාදේශීය සංවර්ධන අංශයට අදාළ වැය විෂය 2021 වසරේ සිට මෙම දෙපාර්තමේන්තුව යටතේ පවතී. 2020 දෙසැම්බර් මස ජල හා විදුලි බිල්පත් වටිනාකම 2021 වසරේ ගෙවීමක් වන අතර, 2021 වසරේ ප්‍රාදේශීය සංවර්ධන අංශයට අදාළ වැය විෂය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ පැවති බැවින් හා මුදල් අමාත්‍යාංශයට මෙම බැරකම ගෙවීමට වැය විෂයක් නොමැති බැවින් එම බැරකම මෙම දෙපාර්තමේන්තුවෙන් ගෙවා ඇත.

ආර්.එච්.ඩබ්.ජී. කුමාරසිරි
අධ්‍යක්ෂ ජනරාල්
ප්‍රාදේශීය සංවර්ධන අංශය

o/c

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
தேசிய திட்டமிடல் திணைக்களம்
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
**Department of National Planning**
Ministry of Finance, Economic Stabilization and National Policies
මහලේකම් කාර්යාලය (පළමු මහල), කොළඹ 01. செயலகம் (முதலாம் மாடி), கொழும்பு 01. The Secretariat (First Floor) Colombo 01

ඇමුණුම 5

මගේ අංකය / எனது இல. / My No. NPD/ADM/05/02/2021
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023.04. 21

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

**දෙපාර්තමේන්තු වාහන උපයෝජනය**

උක්ත කරුණට අදාලව ඔබ විසින් එවන ලද අංක TPD/B/NPD/AQ/22/23 හා 2023.04.04 දිනැති ලිපිය හා බැඳේ.

ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ වර්ෂයේ වාහන උපයෝජනය හා ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණයන් සඳහා පහතින් තොරතුරු සපයා ඇත.

01. **දෙපාර්තමේන්තුව සතු වාහන වෙනත් අමාත්‍යාංශ වෙත තාවකාලිකව ලබා දීම.**

ඉහත කරුණට අදාලව පහත අංක දරණ මෙම දෙපාර්තමේන්තුවට අයත් වාහන 05 විධිමත් ලෙස පවරාදීමක් සිදු කර ඇත. (ඊට අදාළ ලිපිවල පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| වාහන අංකය | විගණන විමසුමේ සඳහන් පරිදි පවරන ලද දෙපාර්තමේන්තුව අමාත්‍යාංශය | මුදාහරින දිනය | අදාළ ලිපි අංකය හා දිනය | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| WP KH 5629 | ලේකම් ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය | 2022.03.29 | NP/ADM/05/02/13/2021 හා 2022.03.29 | ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත් කිරීමේ අමාත්‍යාංශය වෙත නොව , මුදල් අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි පවරා දී ඇත. |
| WP KP 9601 | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 2022.11.04 | NP/ADM/05/02/13/2022 හා 2022.11.04 | මුදල් අමාත්‍යාංශය වෙත විධිමත්පරිදි තාවකාලිකව ලබාදී ඇත |
| WP KQ 6923 | මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ | 2022.10.06 | NP/ADM/05/04 හා 2022.10.06 | මුදල් අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි තාවකාලිකව ලබාදී ඇත. |

දුරකථන / தொலைபேசி / Telephone 0094 11 248 4566 (Director General) 0094 11 248 4612 (Office) 0094 11 248 4613
ෆැක්ස් / பெக்ஸ் / Fax 0094 11 244 8063 0094 11 243 1620
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / Email / Web page dnpd@npd.treasury.gov.lk www.npd.gov.lk

| | | | | |
|---|---|---|---|---|
| WP PA 6270 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 2022.10.06 | NP/ADM/05/02/13/2022 හා 2022.05.25 NP/ADM/05/02/13/2021 හා 2022.03.30 | ආර්ථික ප්‍රතිපත්ති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය වෙත 2022.03.30 දිනැති ලිපියෙන් විධිමත් පරිදි පවරා දීමට කටයුතු සිදු කරන අතරතුර එම අමාත්‍යාංශය අහෝසිවීම නිසා නැවත එම වාහනය 2022.05.25 දිනැති ලිපිය මඟින් තාවකාලිකව මුදල් අමාත්‍යාංශයට ලබා දී ඇත. |
| WP NB 3597 | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 2022.09.20 | NP/ADM/05/02/13/2022 හා 2022.11.04 | තාවකාලික මුදල් අමාත්‍යාංශයට ලබාදී ඇත. |

02 **නිසි පරිදි ලේඛන හා වාර්තාවන් පවත්වා නොගැනීම**

සටහන් කර ගත් අතර, KO -0432 / KO -5871 KA 4592 අංක දරණ වාහන සංචිත වාහන වන බැවින් නිල වාහන සඳහා පවත්වාගත යුතු ඇමුණුම 1 පරිදි සටහනක් පවත්වාගෙන ගොස් නොමැති බව දන්වා සිටිමි.

03. **ඉන්ධන පරීක්ෂාවන් සිදු නොකිරීම**

ප්‍රධාන අලුත්වැඩියා කටයුතු වලින් පසුව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදු කර ඇත. අංක WP KA – 4592 දරණ වාහනය 2019.09.04 දින ඉන්ධන පරීක්ෂාවක් සිදු කර ඇත. සඳහන් කර ඇති සංචිත වාහන රා.පරි.ච.ලේ 30/2016 අනුව ඉන්ධන පරීක්ෂාව සඳහා නගරය තුල සහ නගරයෙන් පිටත 80 KM ධාවනය කල යුතු අතර, මේ සඳහා එක් වාහනයක් සඳහා ලීටර් 12 ආසන්න ප්‍රමාණයක් වැය වේ යැයි අපේක්ෂා කෙරේ. සමාලෝචන වර්ෂයේ රටේ පැවැති තත්වයක් සමඟ ඉන්ධන ලබාගැනීමේ ඇති වූ දුෂ්කරතා හේතුවෙන් ඉන්ධන පරීක්ෂණය ද බෙදාහැරීම යහපත් තත්වයට පත්වූ පසුව එම පරීක්ෂාවන් සිදු කරන ලෙසට සටහන් කර ඇත. මෙම වසර තුල එම පරීක්ෂාව සංචිත වාහන සඳහා සිදු කිරීමට සටහන් කර ගනිමි.

ආර්.එච්.ඩබ්.ඒ.කුමාරසිරි

අධ්‍යක්ෂ ජනරාල්

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්වය |
|---|---|
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | මෙම ණය ශේෂ මේ වන විට නිරවුල් කර ඇත. |
| ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබිණි.<br><br>ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හා අහිතකර මට්ටමේ විය. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවියේ කොටසක් වන අතර ඒ සඳහා අවශ්‍ය සංවර්ධනයන් සිදු කරනුයේ මුදල් අමාත්‍යාංශ මගිනි. වෙබ් අඩවියේ අවශ්‍ය සංශෝධන කිරීම සඳහා මුදල් අමතාංශය වෙත දැනුම් දී ඇත.<br><br>විගණනය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු සිදු කර ඇත. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.**

| පළමු කොටස : 93.00 | | |
|---|---|---|
| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්වය |
| 01. | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | 2022 වර්ෂයේ සිට හානි හා පාඩු පිළිබඳ ලේඛණය යාවත් කාලීනව පවත්වා ගෙන යනු ලබයි. |
| 02. | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |
| 03. | සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | සංචිත වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත. |
| 04. | සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි. | සෑම වාහනයක් සඳහාම ලොග් පොත් 2022 වර්ෂයේ සිට යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. |
| 05. | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 103, 104 109 හා 110 ප්‍රකාරව නියමිත පරිදි කටයුතු කර ඇත. |
| 06. | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර ඇත. |

| දෙවැනි කොටස : 98.00 | |
|---|---|
| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්වය |
| 01. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට වෙනම වෙබ් අඩවියක් නොමැති අතර මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යටතේම මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කරනු ලබයි. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

කේ. ඒ. විමලේන්තිරරාජා
අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.**

ආකෘති පත්‍රය (අංක 01)

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | පැවති කොවිඩ් 19 වසංගත වාතාවරණය යටතේ අපේක්ෂිත පරිදි පුහුණු වීම් සිදු කිරීමට නොහැකි වූ අතර MF/NB/07/CM/2021/163 හා 2021.08.28 දිනැතිව නිකුත්කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි 2021 වර්ෂයේ දී කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ වියදම් අඩු කර ඒ අනුව පුහුණු අවස්ථාවන් සිදු කල අතර 2022 වර්ෂයේ සැලසුම් කර පරිදි පුහුණු කටයුතු සිදු කරන ලදී. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

කේ. ඒ. රම්‍යා කාන්ති
කොම්ප්ට්‍රොලර් ජනරාල්
කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

කොම්ප්ට්‍රෝලර් ජනරාල්

කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

දෙපාර්තමේන්තුවේ නම : විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම**

<u>ආකෘති පත්‍රය (අංක 01)</u>

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය |
|---|---|
| **පළමු කොටස : 99.00**<br><br>2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලමු දෙවන හා තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් , නිලධාරීන් ගෙන්වන ලද්දේ වැඩ වාර ක්‍රමයට (roster) බැවින්, මුරපද වෙනස් කිරීමේ කටයුතු සිදු කිරීම අතපසු විය. වර්තමානයේදී එම මුරපද වෙනස් කිරීම් කටයුතු අදාළ චක්‍රලේඛය පරිදි සිදුවේ. |
| **දෙවැනි කොටස : 95.00**<br><br>සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. | කොවිඩ් 19 වසංගත රෝග තත්ත්වය හේතුවෙන් පුහුණු සඳහා නිලධාරීන් කැඳවීම, රැස්කිරීම සීමා කිරීමට සිදු වූ බැවින් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් සහභාගී කරවා ගැනීමට නොහැකි විය. වර්තමානයේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අවශ්‍යතාව අනුව සහභාගී කරවීමට කටයුතු සලසා ඇත. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ඩී.ඒ.පී. අබේසේකර
අධ්‍යක්ෂ ජනරාල්
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම**

ආකෘති පත්‍රය (අංක 01)

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට / වත්මන් තත්ත්වය සඳහා කමිටුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|
| 01. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි | අදාල ආකෘතිය අනුව සකස් වී නොතිබුණත් මෙම දෙපාර්තමේන්තුව මඟින් 2022 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනයට අදාලව පුහුණු අවශ්‍යතා හඳුනාගෙන දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර තිබුණි. (පිටපතක් අමුණා ඇත) 2022 වර්ෂයේ තවදුරටත් පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් පැවති ඉන්ධන හිඟතාවය නිසා නිලධාරීන් වැඩි පිරිසක් මාර්ගගතව පමණක් සීමිත රාජකාරීවල යෙදී සිටි අතර නිලධාරීන්ගේ පැමිණීම ඉතා සීමා සහිතවී තිබූ බැවින් අදාල ආකෘතිය අනුව විධිමත් මානව සම්පත් සැලැස්මක් අනුව කටයුතු කිරීමට අවස්ථාවක් නොමැති විය.<br><br>එසේම නිලධාරීන්ගේ පැමිණීම සීමා සහිත වීම නිසා කාර්ය සාධනය සම්බන්ධ නිශ්චිත ගිවිසුම්වලට එළඹීමේ දුෂ්කරතා පැවතුණි. නමුත් 2023 වර්ෂය සඳහා 02/2018 දරණ රා.ප.ච විධිවිධාන අනුව මානව සම්පත් සැලස්මක් සකස් කර ඇති අතර කාර්ය සාධන ගිවිසුම්ගතව ඇත. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

ඒ.පී. කුරුම්බලපිටිය
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්වය |
|---|---|
| **පළමු කොටස**<br>සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි | රාජ්‍ය ලාංඡනය මුදල් අමාත්‍යාංශයේ මෙන් ස්ටිකරයක් ලෙස ඇලවීමට කටයුතු කර ඇත. |
| **දෙවැනි කොටස**<br>ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | 2023 වර්ෂයේ සිට වෙබ් අඩවියේ යාවත්කාලීන කර දිගුවක් මඟින් මහජනයාට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා ඇත. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

M. Malarmeet

අධ්‍යක්ෂ ජනරාල්
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

මල්රමේද සංගොදරන්
අධ්‍යක්ෂ ජනරාල්
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.**

ආකෘති පත්‍රය (අංක 01)

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර/ වර්තමාන තත්ත්වය |
|---|---|
| පළමු කොටස : 98.00<br>රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103, 104,109 හා 110 ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.103, 104,109 සහ 110 යටතේ ඉදිරියේ දී සිදු වන අනතුරු සම්බන්ධයෙන් අදාල කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි.<br>2021 වර්ෂය තුළ කොවිඩ්-19 වසංගත තතත්වය හමුවේ නිලධාරීන් හා කාර්ය මණ්ඩල පැමිණීම සීමා කර තිබුණි. ඒ හේතුවෙන් දෙපාර්තමේන්තු කටයුතු සිදු කිරිම ප්‍රමාද වී සිදු වූ අතර, ඉන්ධන ලබා ගැනීමේ දී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය. එබැවින්, එම වසර තුළ ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට දුෂ්කර වීම හේතුවෙන් එම පරීක්ෂණ සිදු කර නොමැත.<br>රා.ප.ච.2016/30 අනුව ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට සටහන් කර ගතිමි. |
| දෙවැනි කොටස : 97.00<br>සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂය තුළ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට අපහසු වූ අතර, ආයතන මඟින් පුහුණු වැඩසටහන් පැවැත්වීමද සීමා කර තිබුණි. එබැවින්, නිලධාරීන් ඒ සඳහා යොමු කිරීම නොකෙරිණි. කෙසේ වුවද ඉදිරියේ දී නිසි පරිදි පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමට අවශ්‍ය විධි විධාන ගනු ලබන බව දන්වා සිටිමි.<br>එමෙන්ම, සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ ස්ථාන මාරු කටයුතු සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් බව ද දන්වා සිටිමි.<br>මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී කණ්ඩායම ලෙස පළපුරුදු හා පුහුණු නිලධාරීන් සිටීම අත්‍යාවශ්‍ය කරුණකි. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආචාර්ය එම්.කේ.සී. සේනානායක
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

ආකෘති පත්‍රය ( අංක 01 )

| පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්වය |
|---|---|
| <u>පළමු කොටස</u>: | |
| 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පළමු දෙවන හා තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබීම. | අදාල කාලසීමාව තුල වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල මුරපද මාරු කිරීම සිදු කර ඇතත්, ඒ පිළිබඳ ලිඛිත වාර්තා තබා ගෙන නොතිබුණි. කෙසේ වෙතත් 2022 වර්ෂයේ සිට මේ දක්වා එම මෘදුකාංගයට අදාලව මුරපද තුන්මසකට වරක් වෙනස් කර එයට අදාලව කටයුතු කල බවට ලිඛිතව අදාල ලේඛණ වල සටහන් කිරීමට කටයුතු කර ඇත. |
| 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබීම. | මෙම දෙපාර්තමේන්තුව සතුව පැවතියේ අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ නිල රථය පමණක් වන බැවින් එහි ඉන්ධන දහනය සම්බන්ධ වාර්තා තබාගෙන නොමැත. කෙසේ වුවද විගණනයෙන් දැනුවත් කළ පසු එය විධිමත් පරිදි සිදුකරමින් පවතී. |
| <u>දෙවන කොටස</u> : | |
| ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබීම. | අදාල කාලසීමාව තුලදී වෙබ් අඩවියේ තිබූ අඩුපාඩු හඳුනාගෙන එය යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින අතර මේ වන විට, පැවති ක්‍රමවේදය විධිමත් කරමින් මුදල් අමාත්‍යාංශ වෙබ් අඩවියේ "Contact us" යොමුව මගින් මහජනතාවට අවශ්‍ය ඕනෑම කාරණයක් පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් හෝ එ් යටතේ ඇති ඕනෑම දෙපාර්තමේන්තුවකින් සෘජුවම පැමිණිලි හෝ ප්‍රශංසා ලබාදීමේ ක්‍රමවේදයක් නිර්මාණය කර ඇත. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

කේ. රවීන්ද්‍ර පත්මප්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

දෙපාර්තමේන්තුවේ නම : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

**ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.**

ආකෘති පත්‍රය ( අංක 01 )

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|
| • වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබීම. | අතිරික්ත හා ඌනතා කිසිවක් නොතිබුනු අතර කෝවිඩ් 19 වෛරසය පාලනය කිරීම සඳහා රජය විසින් නිකුත් කරන ලද යම් යම් චක්‍රලේඛ වලට අනුකූලව අත්‍යාවශ්‍ය රාජකාරී ප්‍රමුඛ කරගෙන එම කාල වකවානුවට අදාලව කාර්යාල කටයුතු පවත්වා ගැනීම හේතුවෙන් ප්‍රසිද්ධ වෙන්දේසිය පැවැත්වීමට සුදුසු වාතාවරණයක් නොතිබුණි. එය දෙපාර්තමේන්තු පාලනයෙන් තොර සිදුවීමක් වන අතර කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි ඉටු කිරීමට ක්‍රියාමාර්ග ගත් පලමු අවස්ථාවේදීම අදාල වෙන්දේසි කටයුතු සිදුකිරීමට දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන ඇත. |
| • සියලු වාහන වල රාජ්‍ය ලාංඡන පින්තාරු කර නොතිබීම. | 2023 වර්ෂයේදී සියලු සංචිත වාහනවල රාජ්‍ය ලාංඡන පින්තාරු කිරීමට කටයුතු කර ඇත. නිලධාරින් වෙත අනුයුක්ත කල සියළුම වාහනවල ඉදිරිපස වීදුරුවේ රාජ්‍ය ලාංඡනය ඇතුළත් අවසරපතක් ප්‍රදර්ශනය කර තිබේ. |
| • වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවැතීම. | 2023 වර්ෂය ආරම්භ වන විට මියගිය හා සේවය අත්හැර ගිය නිලධාරින් තිදෙනෙකුගෙන් රු. 344,178.90 ක ණය මුදලක් අයකර ගැනීමට තිබුණි. මෙම ණය මුදලින් මිය ගිය එක් නිලධාරියෙකුගේ බිරිඳ විසින් රු. 102,498.60 වූ සම්පූර්ණ ණය මුදලද , අනෙක් මිය ගිය නිලධාරියාගේ භාර්යාවගෙන් රු. 44,000.00 ණය ශේෂයක්ද සේවය හැර ගොස් ඇති කාර්යාල කාර්ය සහායකගෙන් රු.26,000.00 ක් ද අය කර ගෙන ඇත. ඒ අනුව අය කරගෙන ඇති මුළු ණය මුදල රු. 172,498.60 ක් වන අතර තව දුරටත් අයවිය යුතු ණය ශේෂය රු. 171,680.30 ක් වේ. එම ණය ශේෂ ද්විත්වය රු. 10,000.00 හා රු. 5,000.00 බැගින් වන මාසික වාරික වලින් අය වෙමින් පවතී. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ජූඩ් නිලුක්ෂාන්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

දෙපාර්තමේන්තුවේ නම : රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 290

ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම.

ආකෘති පත්‍රය ( අංක 01 )

| වාර්තාවේ සඳහන් කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු | ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|
| සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවට අයත් සියලු වාහනවල මුද්‍රිත රාජ්‍ය ලාංඡනය වාහනයේ ඉදිරිපස ප්‍රදර්ශනය කිරීමට සලස්වා තිබුණු අතර, මේ වනවිට මුද්‍රිත ස්ටිකරයක් මගින් වාහනවල බඳෙහි රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කිරීමට කටයුතු සලස්වා ඇත. |
| ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ වෙබ් අඩවිය යටතේ මෙම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියද පවත්වා ගෙන යනු ලබන බැවින් මහජනතාව වෙත සැලසිය යුතු සියලු වෙබ් අවකාශ පහසුකම් අමාත්‍යාංශ වෙබ් අඩවිය යටතේ දැනටමත් සලසා ඇති අතර මහජනයාට සෘජුවම මෙම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වෙත පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවකාශ සලසන ලෙස අදාල පාර්ශවයන් දැනටමත් දැනුවත් කර ඇත. තව ද "තොරතුරු දැනගැනීමේ පනත" යටතේ තොරතුරු නිලධාරි හා බලයලත් නිලධාරිගේ තොරතුරුද දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කර ඇත. |

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290 සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද පියවර සහ නිරීක්ෂණ පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

E.A. Rathnaseela
Director General Public Finance
Department of Public Finance
General Treasury
Colombo 01.